එකී අංක 5884, 3623 සහ 2251 දරන උකස් බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් දහතුන් කෝටි අසූ දෙලක්ෂ දොළොස් දහස් හයසිය හැට හතයි ශත පහළොවක (රු. 138,212,667.15) මුදලක්, 2023.10.26 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් දහතුන් කෝටි අසූ දෙලක්ෂ දොළොස් දහස් හයසිය හැට හතයි ශත පහළොවක (රු. 138,212,667.15) මුදල ද, 2023.10.27 දින සිට අංක 5884, 3623 සහ 2251 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හය කෝටි තිස් හතර ලක්ෂ අනූ දහස් එකසිය හතළිස් පහයි ශත හතළිස් එකක (රු. 63,490,145.41) මුදලක් සඳහා at the rate of Average Weighted Prime Lending Rate + Two per centum (AWPLR + 2%) per annum හා තවත් රුපියල් පන් කෝටි පන් ලක්ෂ හැට හත් දහස් හාරසිය පනස් හතරයි ශත තිස් හතරක (රු. 50,567,454.34) මුදලක් සඳහා at the rate of Average Weighted Prime Lending Rate + Two per centum (AWPLR + 2%) per annum හා තවත් රුපියල් එක්කෝටි තිස් හතර ලක්ෂ හතළිස් හත් දහස් අසූ හතරයි ශත අසූ අටක (රු. 13,447,084.88) මුදලක් සඳහා at the rate of Average Weighted Prime Lending Rate + One per centum (AWPLR + 1%) per annum හා තවත් රුපියල් පනස් තුන් ලක්ෂ තිස් හතර දහස් එකසිය විසි අටයි ශත නවයක (රු. 5,334,128.09) මුදලක් සඳහා at the rate of Average Weighted Prime Lending Rate + One per centum

(AWPLR+1%) per annum බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 5884, 3623 සහ 2251 දරන උකස් බැඳුම්කර මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන එන්. යූ. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලියයුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මහරගම නගර සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ මහරගම, අංක 530 දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ පන්නිපිටිය ග්‍රාමයේ පිහිටි "කැකුණගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන කේ. ඩබ්ලිව්. එස්. කේ. වික්නරාජා යන අය විසින් සාදන ලද 2016.03.24 දාතම හා අංක 2016-422 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් X වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : දැනට පවත්නා මාර්ගය, හයිලෙවල් පාර සහ අංක 3296 දරන පිඹුරේ ලොට් $2E^{2A}$, නැගෙනහිරට : අංක 3296 දරන පිඹුරේ ලොට් $2E^{2A}$, මෙහි ලොට් Y සහ ඇරැව්වල පාර, වරිපනම් අංක 4 දරන පරිශ්‍රයන්, දකුණට : ඇරැව්වල පාර, වරිපනම් අංක 4 දරන පරිශ්‍රයන් සහ බස්නාහිරට: අංක 3555 දරන එකී පිඹුරේ ලොට් $2D^{5A}$ සහ අංක 3992 දරන එකී පිඹුරේ ලොට් $2D^{5B1}$ යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තිස් තුනක් (පර්. 33) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 2016-422 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව B 432/64 යටතේ දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

පහත සඳහන් ඉඩම දිගේ හා ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමග ය :

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මහරගම නගර සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ මහරගම, අංක 530 දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ පන්නිපිටිය ග්‍රාමයේ පිහිටි "කැකුණගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන කේ. ඩබ්ලිව්. එස්. කේ. වික්නරාජා යන අය විසින් සාදන ලද 2016.03.24 දාතම හා අංක 2016-422 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් Y වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්: උතුරට : අංක 2870 දරන පිඹුරේ ලොට් 2E3 සහ අංක 2870 දරන පිඹුරේ ලොට් 2E4, නැගෙනහිරට: ඇරැව්වල පාර, දකුණට : ඇරැව්වල පාර, වරිපනම් අංක 4 දරන පරිශ්‍රයන් සහ බස්නාහිරට : මෙහි ලොට් X යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් හතරයි දශම හයයි බිංදුවක් (පර්. 4.60) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 2016-422 දරන පිඹුරට අනුව ය.

එකී ලොට් Y පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි :

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මහරගම නගර සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ මහරගම, අංක 530 දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ පන්නිපිටිය ග්‍රාමයේ පිහිටි "කැකුණගහවත්ත" යයි කියනු ලබන ඉඩමට (අංක 60730 දරන පිඹුරේ ලොට් 2H හි නැවත මිනුමක් වන) බලයලත් මානක තැන කේ. ඩබ්ලිව්. එස්. කේ. වික්නරාජා යන අය විසින් සාදන ලද 2013.06.04 දාතම හා අංක 2013-607 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 2 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : අංක 2870 දරන පිඹුරේ ලොට් 2E3 සහ අංක 2870 දරන පිඹුරේ ලොට් 2E4, නැගෙනහිරට: ඇරැව්වල පාර, දකුණට : ඇරැව්වල පාර, වරිපනම් අංක 4 දරන පරිශ්‍රයන් සහ බස්නාහිරට : මෙහි ලොට් 1 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් හතරයි දශම හයක් (පර්. 4.6) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සමග එකී අංක 2013-607 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව B 151/80 යටතේ දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

(උකස් බැඳුම්කර අංක 5884 සහ 3623 මගින් හා ඒ යටතේ උකස් කොට ඇප කොට ඇත.)

2. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, කටාන ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ ගනේපොල ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ කොටරුපේ ග්‍රාමයේ පිහිටි "මීගහවත්ත, කහටග හවත්ත සහ කහටගහ ඕවිට" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එල්. පී. ඒ. ශාන්ත-ප්‍රිය යන අය විසින් සාදන ලද 2014.04.05 දාතම හා අංක 3466 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 2 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : පාර (ප්‍රාදේශීය සභා), නැගෙනහිරට : මාලනී විනීෆෙඩ් සහ වෙනත් අය විසින් හිමිකම් කියන

ඉඩම, දකුණට : මාලනී විනීෆෙඩ් සහ වෙනත් අය විසින් සහ ඒ. ඩබ්ලිව්. ඒ. ඩී. නිමල්සිරි විසින් හිමිකම් කියන ඉඩම් සහ බස්නාහිරට : එස්. චන්ද්‍රසිරි විසින් හිමිකම් කියන ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් දෙකයි පර්චස් තුනයි දශම තුනක් (රූ. 2, පර්. 3.3) (හෙක්. 0.2108) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියළු දේ සමග එකී අංක 3466 දරන පිඹුරට අනුව ය.

එකී ලොට් 2 පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි :

එකී කොටරුපේ ග්‍රාමයේ පිහිටි "මීගහවත්ත, කහටගහවත්ත සහ කහටගහ ඕවිට" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන කේ. ඒ. එෆ්. ප්‍රනාන්දු යන අය විසින් සාදන ලද 1998.07.25 දාතම හා අංක 2666/98 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 2 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : පාර (ප්‍රාදේශීය සභා), නැගෙනහිරට : මාලනී විනීෆෙඩ් වෙනත් අයගේ ඉඩම, දකුණට : මාලනී විනීෆෙඩ් සහ වෙනත් අයගේ ඉඩම සහ ජෝන් අප්පුහාමිගේ ඉඩම සහ බස්නාහිරට : මෙහි ලොට් 3 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් දෙකයි පර්චස් එකොළහයි දශම හයයි එකක් (රූ.2, පර්. 11.61) (හෙක්. 0.23170) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියළු දේ සමග එකී අංක 2666/98 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව H 161/100 යටතේ මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

(උකස් බැඳුම්කර අංක 2251 මගින් හා ඒ යටතේ උකස් කොට ඇප කොට ඇත.)

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

01-39

---

**සම්පත් බැංකුව පීඑල්සී**

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය.

වයි. ඒ. එන්. යූ. කුමාර සහ එන්. එම්. ජේ. නිමංකා
ගිණුම් අංකය : 1188 5485 2157

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2023.11.30 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110 හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ජේ. බන්ඩාර යන අය විසින් ලියා සහතික කරන ලද 2015.10.09 දින හා අංක 6477 දරන සහ 2017.10.30 දින හා අංක 5456 උකස් බැඳුම්කර දෙක මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ යාපා අප්පුහාමිලාගේ නයන උදයප්‍රිය කුමාර සහ නවරත්න මුදියන්සේලාගේ ජයමාලි නිමංකා බන්ධනදායීන් වශයෙන් හා එකී නවරත්න මුදියන්සේලාගේ ජයමාලි නිමංකා උකස්කරු වශයෙන් ද පැහැර හැර ඇති හෙයින් ද, එකී අංක 4677 සහ 5456 දරන උකස් බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුළුමුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් දෙකෝටි හැට එක් ලක්ෂ හැට අට දහස් හාරසිය දෙකයි ශත හැත්තෑ හයක (රු. 26,168,402.76) මුදලක් 2023.11.06 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් දෙකෝටි හැට එක් ලක්ෂ හැට අට දහස් හාරසිය දෙකයි ශත හැත්තෑ හයක (රු. 26,168,402.76) මුදල ද, 2023.11.07 දින සිට අංක 4677 සහ 5456 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් එක් කෝටි හැට පන් ලක්ෂ තිස් දහසක (රු. 16,530,000.00) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ හතරයි දශම පහක් (14.5%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 4677 සහ 5456 දරන උකස් බැඳුම්කර මගින් ලබාග න්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන එන්. යූ. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලියයුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

**උපලේඛනය**

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, කිනිගොඩ කෝරළේ, මැද්දේ මැදිලිය පත්තුවේ, රඹුක්කන ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල කොට්ඨාසයේ, මොට්ටප්පුලිය ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ මොට්ටප්පුලිය ග්‍රාමයේ පිහිටි "නිකගොල්ලේ එස්ටේට් නොහොත් අරිත්තගලේ හේනේ වත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එච්. එම්. ආර්. ටී. කේ. හේරත් යන අය විසින් සාදන ලද 2015.03.30 දාතම හා අංක 106/2015 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : මෙම

ඉඩමේ ඉතිරි කොටස, නැගෙනහිරට : කරඳුපොන හන්දිය සිට රඹුක්කන දක්වා පාර (මා සං අ), දකුණට : පාර - පිවිසුම (අඩි 20 පළල) සහ බස්නාහිරට : අංක 2953/99/KG දරන පිඹුරේ ලොට් 07 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසි හතක් (පර්. 27) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියළු දේ සමග එකී අංක 106/2015 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව G 172/93 යටතේ කෑගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී ලොට් 1, බලයලත් මානක තැන එස්. ආර්. පී. එල්. සේනානායක යන අය විසින් සාදන ලද 2005.12.27 දාතම හා අංක 5346/2005/KG දරන පිඹුරේ නිරූපිත ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩමේ නැවත මිනුමක් වන අතර තවත් අයුරකින් පහතින් මැනවින් විස්තර වන බලයලත් මානක තැන ඩී. රත්නායක යන අය විසින් සාදන ලද 1998.09.27 දාතම හා අංක 2728 දරන පිඹුරේ නිරූපිත ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩමේ නැවත මිනුමකි :

එකී මොට්ටප්පුලිය ග්‍රාමයේ පිහිටි "නිකගොල්ලේ එස්ටේට් *නොහොත්* අරිත්තගලේ හේනේ වත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩී. රත්නායක යන අය විසින් සාදන ලද 1998.09.27 දාතම හා අංක 2728 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට සහ ඊසානට : බලයලත් මානක තැන සී. කුරුකුලසූරිය යන අය විසින් සාදන ලද 2363 දරන පිඹුරේ ලොට් 1, ගිණිකොනට: රඹුක්කන - කෑගල්ල ප්‍රධාන පාර, නිරිතට සහ බස්නාහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසි හතක් (පර්. 27) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියළු දේ සමග එකී අංක 2728 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව G 92/107 යටතේ කෑගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

01-30

---

**සම්පත් බැංකුව පීඑල්සී**

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය.

චමත්කාර් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ගිණුම් අංකය : 0211 1000 2022 (1)

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2023.11.30 වැනි දින පවත්වන්නට යෙදුන රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110 හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඩබ්ලිව්. ඩී. එම්. විතානගේ යන අය විසින් ලියා සහතික කරන ලද 2017.07.27 දින හා අංක 1484 දරන සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස්වරුන් වන ආර්. ජී. ඩී. සුනාරි යන අය විසින් ලියා සහතික කරන ලද 2017.10.11 දින හා අංක 5783 දරන සහ ටී. කරුණාතිලක යන අය විසින් ලියා සහතික කරන ලද 2019.11.25 දින හා අංක 2249 සහ 2022.08.26 දින හා අංක 3621 දරන උකස් බැඳුම්කර දෙක යන උකස් බැඳුම්කර සියල්ල මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ලියාපදිංචි අංක PV 91112 දරන ශ්‍රී ලංකා සමාගම් නීතීන් යටතේ නිසිලෙස සංස්ථා ගතකොට ඇති සමාගමක් වන චමත්කාර් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ් බන්ධනදායි වශයෙන් හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ලියාපදිංචි අංක PV 90552 දරන ශ්‍රී ලංකා සමාගම් නීතීන් යටතේ නිසිලෙස සංස්ථා ගතකොට ඇති සමාගමක් වන සෙනුර ඉන්ට(ර්)නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ් උකස්කරු වශයෙන් ද පැහැර හැර ඇති හෙයින් ද, එකී අංක 1484, 5783, 2249 සහ 3621 දරන උකස් බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුලුමුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් දස කෝටි හැට පන් ලක්ෂ හැට අට දහස් අටසිය දහ හතරයි ශත පහළවක (රු. 106,568,814.15) මුදලක්, 2023.10.26 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් දස කෝටි හැට පන් ලක්ෂ හැට අට දහස් අටසිය දහ හතරයි ශත පහළවක (රු. 106,568,814.15) මුදල ද, 2023.10.27 දින සිට අංක 1484, 5783, 2249 සහ 3621 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුලුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් දස කෝටි විසි ලක්ෂයක (රු. 102,000,000.00) මුදලක් සඳහා at the rate of Average Prime Lending Rate + Two per centum (AWPLR+2%) per annum බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 1484, 5783, 2249 සහ 3621 දරන උකස් බැඳුම්කර මගින් ලබාග න්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන එන්. යූ. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලියයුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කොරළේ, පල්ලේ පත්තුවේ, තිඹිරිගස්යාය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාස තුළ සහ මහ නගර සභා සීමාවන් තුළ කුරුඳුවත්ත ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ කුරුඳුවත්ත, වෝඩ් අංක 36 පිහිටි කොළඹ 07, කිංසි පාර, වර්තමානයේ වරිපනම් අංක 171/1 දරන බලයලත් මානක තැන එල්. පී. ඒ. ශාන්ත - ප්‍රිය පෙරේරා යන අය විසින් සාදන ලද 2015.09.23 දාතම හා අංක 3946 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : කිංසි පාර, වරිපනම් අංක 165 දරන සහ මහමාන්‍ය ඩී. එස්. සේනානායක මාවත, වරිපනම් අංක 124 දරන ඉඩම්, නැගෙනහිරට : මහමාන්‍ය ඩී. එස්. සේනානායක මාවත, දකුණට : කිංසි පාර, වරිපනම් අංක 171/5 දරන ඉඩම සහ අඩි 10 පළල පාර සහ බස්නාහිරට : අඩි 10 පළල පාර සහ කිංසි පාර, වරිපනම් අංක 171 දරන ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහයයි දශම එකයි නවයක් (පර්. 10.19) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සමග එකී පිඹුරට අනුව ය.

එකී ලොට් 1 පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කුරුඳුවත්ත, වෝඩ් අංක 36, තිඹිරිගස්යාය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ සහ මහ නගර සභා සීමාවන් තුළ කුරුඳුවත්ත ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කිංසි පාරේ පිහිටි වර්තමානයේ, වරිපනම් අංක 171/1 දරන බලයලත් මානක තැන ඒ. පී. එස්. ගුණවර්ධන යන අය විසින් සාදන ලද 1978.08.25 දාතම හා අංක 996 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 2B වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්: උතුරට : අංක 996 දරන එකී පිඹුරේ ලොට් 1 සහ මනමාන්‍ය ඩී. එස්. සේනානායක මාවත, වරිපනම් අංක 124 දරන පරිශ්‍රයන්, නැගෙනහිරට : අංක 996 දරන එකී පිඹුරේ ලොට් 3, දකුණට : අංක 996 දරන එකී පිඹුරේ ලොට් 2C1 සහ 2E සහ බස්නාහිරට : අංක 996 දරන එකී පිඹුරේ ලොට් 2A යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහයයි දශම එකයි නවයක් (පර්. 10.19) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සමග එකී පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව E 65/132 යටතේ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අංක 996 දරන එකී පිඹුරේ නිරූපිත ලොට් 2E (පාර සඳහා වෙන්කිරීම) දිගේ හා ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

01-40

### ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී

**1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී විසින් සම්මත කරගන්නා ලද යෝජනාව පිළිබඳ දැන්වීමයි**

ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනාව 2023 නොවැම්බර් මස 29 වැනි දින ඒකමතිකව සම්මත කරගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාව

ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී නමට ප්‍රසිද්ධ නොතාරිස් එස්. කේ. එන්. ඒ. කුරේරා විසින් සියල්ල ලියා සහතික කරන ලද 2016.06.20 දිනැති අංක 7700, 2017.03.10 දිනැති අංක 8095, 2017.07.21 දිනැති අංක 8290, 8292, 8294 සහ 2018.03.26 දිනැති අංක 8651 සහ 8653 දරන උකස් බැඳුම්කරයන් මත අයවිය යුතු ගෙවීම් කිරීම, සිය ලියාපදිංචි කාර්යාලය අනුරාධපුරයේ පවත්වාගෙන යන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සමාගම් පනත යටතේ යථා පරිදි ලියාපදිංචි කරන ලද PV 109022 දරන ළහිරු රූෆිං (ප්‍රයිවෙට්) ලිමිටඩ් (මෙහි මින්මතු "සමාගම" යනුවෙන් හඳුන්වනු ලබන) විසින් පැහැර හැර ඇති හෙයින් ද,

2023 ජුනි මස 30 වැනි දිනට එකී ළහිරු රූෆිං (ප්‍රයිවෙට්) ලිමිටඩ් යන අයගෙන් ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී වෙත ඉහත කී අංක 7700, 8095, 8290, 8292, 8294, 8651 සහ 8653 දරන උකස් බැඳුම්කරයන් මත රුපියල් නව කෝටි හතළිස් පන් ලක්ෂ පනස් හය දහස් අටසිය අසූ හතරයි ශත එකොළහක (රු. 94,556,884.11) මුදලක් ද, 2023 ජූලි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා රුපියල් පනස් ලක්ෂ තිස් හතර දහස් පන්සිය හැට හතරයි ශත විසි හතක (රු. 5,034,564.27) මුදල මත සෑම මාසයකම වැඩ කරන පළමුවන දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන සාමාන්‍ය බර තැබූ මධ්‍ය මූලික ණය පොළී අනුපාතයට (AWPR) ඉහළින් ආසන්නතම 0.5% ට වටයනු ලබන්නා වූ වර්ෂයකට සියයට හයක් (6%) බැගින් වූ අනුපාතය මත ගණනය කරන ලද පොළිය ද, රුපියල් නව ලක්ෂ හතළිස් පන් දහස් තුන්සිය විසි අටයි ශත විසි අටක (රු. 945,328.28) මුදල මත වර්ෂයකට සියයට දහ හතයි දශම පහක් (17.5%) බැගින් වූ ස්ථිර අනුපාතය මත ගණනය කරන ලද පොළිය ද, රුපියල් තුන් කෝටි අනූ එක් ලක්ෂ හතළිස් නව දහස් අසූ හතයි ශත හැත්තෑ පහක (රු. 39,149,087.75) මුදල මත සෑම මාසයකම වැඩ කරන පළමුවන දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන සාමාන්‍ය බර තැබූ මධ්‍ය මූලික ණය පොළී අනුපාතයට (AWPR) ඉහළින් ආසන්නතම 0.5% ට වටයනු ලබන්නා වූ වර්ෂයකට සියයට හයයි දශම පහක් (6.5%) බැගින් වූ අනුපාතය මත ගණනය කරන ලද පොළිය ද, රුපියල් තුන් කෝටි හතළිස් හය ලක්ෂ හතළිස් දෙදහස්

අටසිය තිස් හතයි ශත හැට දෙකක (රු. 34,642,837.62) මුදල මත පවත්නා අනුපාතය අනුව සෑම මාසයකම වැඩ කරන පළමුවන දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන සාමාන්‍ය බර තැබූ මධ්‍ය මූලික ණය පොළී අනුපාතයට (AWPR SPOT) ඉහළින් වර්ෂයකට සියයට හයයි දශම පහක් (6.5%) බැගින් වූ අනුපාතය මත ගණනය කරන ලද පොළිය ද, රුපියල් විසි හත් ලක්ෂ අනූ පන් දහස් පන්සිය හැත්තෑ පහයි ශත විසි එකක (රු. 2,795,575.21) මුදල මත වර්ෂයකට සියයට තිස් හයක් (36%) බැගින් අනුපාතය මත ගණනය කරනු ලබන පොළිය ද අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති බැවින් ද,

තව ද, එකී මුදල වන රුපියල් නව කෝටි හතළිස් පන් ලක්ෂ පනස් හය දහස් අටසිය අසූ හතරයි ශත එකොළහක (රු. 94,556,884.11) මුදලක් ද, 2023 ජූලි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා රුපියල් පනස් ලක්ෂ තිස් හතර දහස් පන්සිය හැට හතරයි ශත විසි හතක (රු. 5,034,564.27) මුදල මත සෑම මාසයකම වැඩ කරන පළමුවන දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන සාමාන්‍ය බර තැබූ මධ්‍ය මූලික ණය පොළී අනුපාතයට (AWPR) ඉහළින් ආසන්නතම 0.5% ට වටයනු ලබන්නා වූ වර්ෂයකට සියයට හයක් (6%) බැගින් වූ අනුපාතය මත ගණනය කරන ලද පොළිය ද, රුපියල් නව ලක්ෂ හතළිස් පන් දහස් තුන්සිය විසි අටයි ශත විසි අටක (රු. 945,328.28) මුදල මත වර්ෂයකට සියයට දහ හතයි දශම පහක් (17.5%) බැගින් වූ ස්ථිර අනුපාතය මත ගණනය කරන ලද පොළිය ද, රුපියල් තුන් කෝටි අනූ එක් ලක්ෂ හතළිස් නව දහස් අසූ හතයි ශත හැත්තෑ පහක (රු. 39,149,087.75) මුදල මත සෑම මාසයකම වැඩ කරන පළමුවන දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන සාමාන්‍ය බර තැබූ මධ්‍ය මූලික ණය පොළී අනුපාතයට (AWPR) ඉහළින් ආසන්නතම 0.5% ට වටයනු ලබන්නා වූ වර්ෂයකට සියයට හයයි දශම පහක් (6.5%) බැගින් වූ අනුපාතය මත ගණනය කරන ලද පොළිය ද, රුපියල් තුන් කෝටි හතළිස් හය ලක්ෂ හතළිස් දෙදහස් අටසිය තිස් හතයි ශත හැට දෙකක (රු. 34,642,837.62) මුදල මත පවත්නා අනුපාතය අනුව සෑම මාසයකම වැඩ කරන පළමුවන දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන සාමාන්‍ය බර තැබූ මධ්‍ය මූලික ණය පොළී අනුපාතයට (AWPR SPOT) ඉහළින් වර්ෂයකට සියයට හයයි දශම පහක් (6.5%) බැගින් වූ අනුපාතය මත ගණනය කරන ලද පොළිය ද, රුපියල් විසි හත් ලක්ෂ අනූ පන් දහස් පන්සිය හත්තෑ පහයි ශත විසි එකක (රු. 2,795,575.21) මුදල මත වර්ෂයකට සියයට තිස් හයක් (36%) බැගින් වූ අනුපාතය මත ගණනය කරනු ලබන පොළිය ද, හෝ විකිණීමේ අවස්ථාව දක්වා එයින් නොගෙවා ඉතිරිවී ඇති යම් කොටසක් අයකර ගැනීම සඳහා එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තියේ නියමයන් යටතේ උකස් බැඳුම්කරයේ ප්‍රඥප්ති සමග අනුකූලව ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී විසින් වැය කර ඇති සියලුම මුදල් ද, ප්‍රචාරක ගාස්තු සහ අනෙකුත් අය කිරීම් ද, සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 7700, 8290, 8651, 8653 සහ 8095 දරන උකස් බැඳුම්කරයන් මගින් ළහිරු රූෆිං (ප්‍රයිවෙට්) ලිමිටඩ් විසින් ද, අංක 8294 දරන උකස් බැඳුම්කරය මගින් පතිරණ ගම්ආචාරිගේ තිලක් නන්දසිරි විසින් ද, අංක 8292 දරන උකස් බැඳුම්කරයන් මගින් පල්ලෙවෙල ගම්ආචාරිලාගේ ලහිරු චතුරංග නන්දසිරි විසින් ද, ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී වෙත උකස් කරන ලද පහත විස්තර කරනු ලබන ඉඩම, ගොඩනැගිලි සහ යන්ත්‍ර බලයලත් වෙන්දේසිකරු ජයසූරිය ඇන්ඩ් ජයසූරිය ඔක්ෂනියර්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් ඔවුන් වෙත පැවරී ඇති බලතල අනුව ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා කරයි.

*අංක 7700, 8290 සහ 8651 දරන උකස් බැඳුම්කරයන් මගින් උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තරය*

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නුවරගම් කෝරළේ, නාච්චාදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, විජයපුර ප්‍රාදේශීය සභා බලසීමාව තුළ 259 - 5 ඇල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ආලංකුලම ගමේ පිහිටි, ආලංකුලම කැලේ නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු පී. බී. ඉලංගසිංහ විසින් සදන ලද 2012.05.07 දිනැති අංක 2012/AN/192 දරන පිඹුරේ ලොට් 1 වශයෙන් ලකුණු කරන ලද ඉඩම් කොටසට මායිම් උතුරට : අයි. බී. හේරත්ගේ ඉඩම ද, නැගෙනහිරට : අ.ග.සි. 274 හි ලොට් අංක 4 ද, දකුණට : ලොට් 2 ද සහ බස්නාහිරටː පාර (මාර්ග සංවර්ධන අධිකාරියේ) ද වශයෙන් මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් තිස් පහක් (පර්. 35) *හෙවත්* හෙ. 0.0885ක් විශාල ඉඩම එහි පිහිටි සියලු දේ ද සමග වේ.

*අංක 8292 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තරය*

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නුවරගම් කෝරළේ, නුවරගම් පළාත, මධ්‍යම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඇලයාපත්තුව ප්‍රාදේශීය සභා බලසීමාව තුළ 296 ඉසුරුමුනිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, පොතානේගම ගමේ පිහිටි පොතානේගම කැලේ නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ඒ. ඒ. මුණසිංහ 2016.01.25 දින මනින ලද අංක 06/NPC/2016 දරන පිඹුරේ දැක්වෙන ලොට් 23 වශයෙන් ලකුණු කොට බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්ː උතුරට : අංක 06/NPC/2016 දරන පිඹුරේ ලොට් 20 (පාර) ද, නැගෙනහිරට : අංක 06/NPC/2016 දරන පිඹුරේ ලොට් 22 ද, දකුණට : උඩමලුව පන්සල හිමිකම් කියන කුඹුරු ද සහ බස්නාහිරට : අංක 06/NPC/2016 දරන පිඹුරේ ලොට් 24 ද වශයෙන් මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් පහළොවක් (පර්. 15) *හෙවත්* හෙ. 0.0379ක් විශාල ඉඩම එහි පිහිටි සියලු දේ ද සමග වේ.

ඉහත ඉඩම පහත දැක්වෙන ඉඩමෙන් කොටසක් වේ.

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නුවරගම් කෝරළේ, පොතානේගම ගමේ පිහිටි පොතානේගම කැලේ නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. කේ. සිල්වා විසින් සාදන ලද 2000.07.08 දිනැති අංක 1959 දරන පිඹුරේ දැක්වෙන ලොට් 1/4 වශයෙන් ලකුණු කොට බෙදා වෙන් කරන ලද

ඉඩම් කොටසට මායිම් : උතුරට : ලොට් 3/1045 නමුත් වඩා නිවැරදිව ලොට් 3/1045 සහ ඇල ද, නැගෙනහිරට : පාරක් සඳහා වූ වෙන් කිරීම ද, දකුණට : උඩමලුව විහාරය හිමිකම් කියන ඉඩම ද, සහ බස්නාහිරට : ලොට් 4/1045 ද වශයෙන් මායිම් වූ ප්‍රමාණයෙන් අක්කර දෙකක් (අ.2)ක් විශාල ඉඩම එහි පිහිටි ගොඩනැගිලි සහ අනෙකුත් සියලු දේ ද සමග වේ.

*අංක 8294 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තරය*

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ අධිකාරි පත්තුවේ, මහර ප්‍රාදේශීය සභා බලසීමාව ඇතුළත (අංක 2 නාරංවල උප කාර්යාලය) කිරිල්ලවල ගමේ පිහිටි "නාගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු පී. ඒ. කේ. ජේ. පෙරේරා විසින් සාදන ලද 2001.11.28 දිනැති අංක 3671 දරන පිඹුරේ දක්වෙන ලොට් 2 වශයෙන් ලකුණු කොට බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් : උතුරට : දූන් ඩී. එල්. වීරසිංහගේ උරුමකරුවන්ගේ ඉඩම ද, නැගෙනහිරටඃ ලොට් 3 ද, දකුණට : අංක 3185 දරන පිඹුරේ ලොට් අංක V (මීටර් 6ක් පළල පාර) ද සහ බස්නාහිරට : ලොට් 1 ද වශයෙන් මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් නවයක් (පර්. 9)ක් විශාල ඉඩම එහි පිහිටි සියලු දේ ද සමග වේ.

මෑතක දී කරන ලද මැනීමකට අනුව මෙම ඉඩම පහත පරිදි විස්තර කෙරේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ අධිකාරි පත්තුවේ, මහර ප්‍රාදේශීය සභා බලසීමාව ඇතුළත (අංක 2 නාරංවල උප කාර්යාලය) 287D කිරිල්ලවල උතුර ග්‍රාම සේවා කොට්ඨාසයේ, කිරිල්ලවල ගමේ පිහිටි "නාගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. ඒ. එන්. පී. රණසිංහ විසින් සාදන ලද 2016.12.02 දිනැති අංක 4054 දරන පිඹුරේ දක්වෙන ඉඩම් කොටසට මායිම් : උතුරට : අංක 3671 දරන පිඹුරේ සහ ඩී. එල්. වීරසිංහගේ උරුමකරුවන්ගේ ඉඩම ද, නැගෙනහිරට : ඩී. එල්. වීරසිංහගේ උරුමකරුවන්ගේ ඉඩම සහ අංක 3671 දරන පිඹුරේ ලොට් 3 ද, දකුණට : අංක 3671 දරන පිඹුරේ ලොට් 3 සහ පාර (මීටර් 6ක් පළල) ද සහ බස්නාහිරටඃ පාර (මීටර් 6ක් පළල) සහ අංක 3671 දරන පිඹුරේ ලොට් 1 වශයෙන් මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් නවයක් (පර්. 9ක්) විශාල ඉඩම එහි පිහිටි සියලු දේ ද සමග වේ.

පහත විස්තර කරන බෙදා වෙන් කරන ලද ඉඩම් තුළින් මතින් හා ඔස්සේ වන මාර්ග අයිතීන් හා අනෙක් පොදු අයිතීන් ද සමග වේ.

1. ඉහත කී කිරිල්ලවල පිහිටි "නාගහවත්ත" නමැති ඉඩමේ අංක 3185 දරන පිඹුරේ ලොට් V දරන ඉඩම් කොටසට මායිම් : උතුරට : ලොට් A, B, C, D, E, F, G, H සහ I ද, නැගෙනහිරටඃ ලොට් K ද, දකුණට : ලොට් N, O, P, Q, R, S, T සහ U ද, බස්නාහිරට : අංක 3159 දරන පිඹුරේ ලොට් 13 I ද වශයෙන් මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් විස්සයි දශම හයක් (පර්. 20.6)ක් විශාල ඉඩම එහි පිහිටි සියලු දේ ද සමග වේ.

2. බලයලත් මිනින්දෝරු පී. ඒ. කේ. ජේ. පෙරේරා විසින් සාදන ලද 2001.02.25 දිනැති අංක 3159 දරන පිඹුරේ ලොට් 13 සහ ලොට් 25 (මීටර් 6ක් පළල පාරක් සඳහා වූ වෙන් කිරීම.)

3. බලයලත් මිනින්දෝරු කේ. ජී. හියුබට් පෙරේරා විසින් සාදන ලද 1993.10.25 දිනැති අංක 5313 දරන පිඹුරේ ලොට් 9.

*අංක 8095 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තරය*

චංචල පිරියත, යන්ත්‍ර සහ උපකරණ ඇතුළත්ව සම්පූර්ණයෙන්ම -

යන්ත්‍ර ලැයිස්තුව :

| *අයිතමය [Item]* | *විස්තරය [Decription]* | |
|---|---|---|
| හයිඩ්‍රොලික් ප්ලේට් ප්‍රෙස් බෙන්ඩර් [Hydraulic Plate Press Bender] | වර්ගය - WC67Y<br>දිග - අඩි 10.5<br>පීඩනය -125 ටී<br>ඒකක අංක - 12019086<br>නිෂ්පාදනය - චීනය | [Type – WC67Y]<br>[Length – 10.5 Ft]<br>[Pressure – 125 T]<br>[Unit No. – 12019086]<br>[Made in – China] |

| *අයිතමය [Item]* | *විස්තරය [Decription]* | |
|---|---|---|
| හයිඩ්‍රොලික් ප්ලේට් ප්‍රෙස් බෙන්ඩර්<br>[Hydraulic Plate Press Bender] | වර්ගය - WC67Y<br>දිග - අඩි 13<br>පීඩනය -160 ටී<br>ඒකක අංක - 15060786 | [Type – WC67Y]<br>[Length – 13 Ft]<br>[Pressure – 160 T]<br>[Unit No. – 15060786] |
| හයිඩ්‍රොලික් ෂෙයාරිං මැෂින්<br>[Hydraulic Shearing Machine] | වර්ගය - QC12Y<br>දිග - අඩි 8<br>උපරිම ඝණකම - මිමී. 6<br>ඒකක අංක - 12069762 | [Type – QC12Y]<br>[Length – 8 Ft]<br>[Maximum Thickness – 6 mm]<br>[Unit No. – 12069762] |
| හයිඩ්‍රොලික් ෂෙයාරිං මැෂින්<br>[Hydraulic Shearing Machine] | වර්ගය - QC12Y<br>දිග - අඩි 10<br>උපරිම ඝණකම - මිමී. 10<br>ඒකක අංක - 15060785 | [Type – QC12Y]<br>[Length – 10 Ft]<br>[Maximum Thickness – 10 mm]<br>[Unit No. – 15060785] |
| ඩබල් ලේයර් රූෆිං ෆෝම් ඇන්ඩ් ක්ලැඩිං ප්‍රොෆයිල් මැෂින්<br>[Double Layer Roofing Forming & Cladding Profile Machine] | ෂීට් සයිස් - මිමී 914<br>ඝනකම - මිමී 0.3 - 0.6<br>ටොප් ලේයර් රෝලර් - 14<br>ලේයර් රෝලර් - 17<br>ෂාෆ්ට් සයිස් - මිමී 68<br>නිෂ්පාදනය - චීනය | [Sheet size – 914mm]<br>[Thickness – 0.3 - 0.6 mm]<br>[Top layer roller – 14]<br>[Layer roller – 17]<br>[Shaft size – 68 mm]<br>[Made in – China] |
| රූෆිං ෂීට් පන්චිං කර්විං මැෂින්<br>[Roofing Sheet Punching, Curving Machine] | ෂීට් සයිස් - මිමී 914<br>ඝනකම - මිමී 0.3 - 0.6<br>නිෂ්පාදනය - චීනය | [Sheet size – 914 mm]<br>[Thickness – 0.3 – 0.6 mm]<br>[Made in – China] |
| රෝලර් ෂටර් යූ චැනල් මැෂින් විත් ඔටොමැටික් හයිඩ්‍රොලික් කටර්<br>[Roller Shutter U Channel Machine with Automatic Hydraulic cutter] | හයිඩ්‍රොලික් කටර් ඇන්ඩ් මැනුවල් ඩී කොයිලර්<br>[Hydraulic cutter and manual de coiler]<br>රෝලර් ගණන - 16<br>නිෂ්පාදනය - චීනය | <br><br><br><br>[No. of rollers - 16]<br>[Made in – China] |

සහ අමතර කොටස් උපාංග සහ උපකරණ ද, අනුරාධපුර, කුරුණෑගල පාර, 2 වන සැතපුම් කණුව, A349/234 දරන ස්ථානයේ දැනට තබා තිබෙන යම් අවස්ථාවක හා කලින් කල ගබඩා කර හෝ තබා තිබිය හැකි වෙනත් යම් ගුදමක, ගබඩාවක හෝ පරිශ්‍රයක් තුළ හෝ මත දැනට තිබෙන වෙනත් සියලු චංචල පිරියත, යන්ත්‍රෝපකරණ, කලින් කල හා සෑමකල්හිම ගබඩා කර තබනු ලැබිය හැකි පරිශ්‍රයක තිබෙන සෑම ආකාරයකම හා සියලු විස්තරවලට අයත්වන සමාගමේ වෙනත් සියලු චංචල, පිරියත යන්ත්‍ර, උපකරණ සහ උපාංග සහ සෑම කල්හිම වරින් වර එකී පරිශ්‍රයට ගෙන එනු ලැබිය හැකි හෝ ඒ පරිශ්‍රයක තබා තැබිය යුතු හා හැකි සමාගමේ වෙනත් සියලු චංචල දේපළ සහ මින් මතු යම් අවස්ථාවක සහ වරින් වර එහි ව්‍යාපාරය හෝ කර්මාන්තය හෝ ගබඩාවට ගෙනයනු ලැබිය හැකි, ව්‍යාපාර ස්ථානවලට හෝ ව්‍යාපාර ස්ථානයකට හෝ ගෙන එනු ලැබිය හැකි, එකී ව්‍යාපාර චංචල, පිරියත, යන්ත්‍රෝපකරණ අමතර කොටස් සහ උපාංග ද සමග වේ.

*උකස් බැඳුම්කර අංක 8653*

චංචල පිරියත, යන්ත්‍ර සහ උපකරණ ඇතුළත්ව සම්පූර්ණයෙන්ම -

යන්ත්‍ර ලැයිස්තුව ඃ

| *අයිතමය [Item]* | *විස්තරය [Decription]* | |
|---|---|---|
| රූෆිං ෂීට් පන්චිං ඇන්ඩ්, කර්විං මැෂින්<br>[Roofing Sheet Punching and curving machine] | චීනයේ නිපදවන ලදී.<br>අනුක්‍රමික අංකය - | [Made in – China]<br>MFM434689<br>[Serial No. MFM434689] |
| රෝලර් ෂටර් යූ චැනල් මැෂින් විත් හයිඩ්‍රොලික් කටර්<br>[Roller shutter u channel machine with Hydraulic cutter ] | චීනයේ නිපදවන ලදී.<br>අනුක්‍රමික අංකය - | [Made in – China]<br>RF2334599<br>[Serial No. RF2334599] |
| ඩබල් ලේයර් රූෆිං ෆෝමිං ඇන්ඩ් ක්ලැඩිං ප්‍රොෆයිල් මැෂින්<br>[Double layer roofing forming & Claddingprofile machine] | චීනයේ නිපදවන ලදී.<br>අනුක්‍රමික අංකය - | [Made in China]<br>RF2334567<br>[Serial No. – RF2334567] |
| විත් 2 ඩිකොයිලර් ඔටොමැටික් ස්ලිටිං ඇන්ඩ් ටියුටිං රෝල් ෆෝමිං මැෂින්<br>[With 2 decoiler automactic slitting and tutting roll forming machine] | චීනයේ නිපදවන ලදී.<br>අනුක්‍රමික අංකය - | [Made in China]<br>RF238569<br>[Serial No. – RF238569] |
| විත් 2 ඩිකොයිලර් සී පර්ලින් රෝල් ෆෝමිං මැෂින්<br>[With 2 decoileer c purlin roll forming machine] | චීනයේ නිපදවන ලදී.<br>අනුක්‍රමික අංකය - | [Made in China]<br>MFM533369<br>[Serial No. –MFM533369] |
| විත් 2 ඩිකොයිලර් ස්ටෙප් ටයිල් රෝල් ෆෝමිං මැෂින්<br>[With 2 decoileer step tile roll forming machine] | චීනයේ නිපදවන ලදී.<br>අනුක්‍රමික අංකය - | [Made in China]<br>MXM332456<br>[Serial No. –MXM332456] |
| විත් 2 ඩිකොයිරෝල් ෆෝමිං මැෂින්<br>[With 2 decoileer roll forming machine] | චීනයේ නිපදවන ලදී.<br>අනුක්‍රමික අංකය - | [Made in China]<br>MDL112567<br>[Serial No. –MDL112567] |
| විත් 1 ඩිකොයිලර් හයිඩ්‍රොලික් කර්විං රෝල් ෆෝමිං මැෂින්<br>[With 1 decoileer Hydraulic curving roll forming machine] | චීනයේ නිපදවන ලදී.<br>අනුක්‍රමික අංකය - | [Made in China]<br>SDL238898<br>[Serial No. –SDL238898] |
| විත් 1 ඩිකොයිලර් රෝලර් ෂටර් රෝල් ෆෝමිං මැෂින්<br>[With 1 decoileer roller shutter door roll forming machine] | චීනයේ නිපදවන ලදී.<br>අනුක්‍රමික අංකය - | [Made in China]<br>DDL991353<br>[Serial No. –DDL991353] |
| යුස්ඩ් රෝලර් ඩෝ ෆෝමිං මැෂින්<br>[Used roller door forming machine] | ජපානයේ නිපදවන ලදී.<br>අනුක්‍රමික අංකය - | [Made in Japan]<br>XCL24566<br>[Serial No. – XCL24656] |
| යුස්ඩ් මෙටල් ෂීට් රෝලර් මැෂින්<br>[Used metal sheet roller machine] | ජපානයේ නිපදවන ලදී.<br>අනුක්‍රමික අංකය - | [Made in Japan]<br>RFM733533<br>[Serial No. – RFM733533] |
| ඩීසල් ජෙනරේටර් කේවීඒ 40<br>[Diesel Generator 40KVA] | ඉන්දියාවේ නිපදවන ලදී.<br>අනුක්‍රමික අංකය - | [Made in India]<br>H1503649<br>[Serial No. – H1503649] |

සහ අමතර කොටස් උපාංග සහ උපකරණ ද, අනුරාධපුරය, මහ වීදියේ, නව බස් නැවතුම්පළ, අංක 561/22 දරන ස්ථානයේ දැනට තබා තිබෙන යම් අවස්ථාවක හා කලින් කල ගබඩා කර හෝ තබා තිබිය හැකි වෙනත් යම් ගුදමක, ගබඩාවක හෝ පරිශ්‍රයක්

තුළ හෝ මත දැනට තිබෙන වෙනත් සියලු චංචල පිරියත, යන්ත්‍රෝපකරණ, කලින් කල හා සෑම කල්හි ම ගබඩා කර තබනු ලැබිය හැකි පරිශ්‍රයක තිබෙන සෑම ආකාරයකම හා සියලු විස්තරවලට අයත්වන සමාගමේ වෙනත් සියලු චංචල, පිරියත යන්ත්‍ර, උපකරණ සහ උපාංග සහ සෑම කල්හිම වරින්වර එකී පරිශ්‍රයට ගෙන එනු ලැබිය හැකි හෝ ඒ පරිශ්‍රයක තබා තැබිය යුතු හා හැකි සමාගමේ වෙනත් සියලු චංචල දේපළ සහ මින් මතු යම් අවස්ථාවක සහ වරින්වර එහි ව්‍යාපාරය හෝ කර්මාන්තය හෝ ගබඩාවට ගෙනයනු ලැබිය හැකි, ව්‍යාපාර ස්ථානවලට හෝ ව්‍යාපාර ස්ථානයකට හෝ ගෙන එනු ලැබිය හැකි, එකී ව්‍යාපාර චංචල, පිරියත, යන්ත්‍රෝපකරණ අමතර කොටස් සහ උපාංග ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්,
ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී.

01-27

---

**ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී විසින් සම්මත කරගන්නා ලද යෝජනාව පිළිබඳ දැන්වීමයි

ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනාව 2023 නොවැම්බර් මස 29 වැනි දින ඒකමතිකව සම්මත කරගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාව**

ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී නමට ප්‍රසිද්ධ නොතාරිස් ඩී. අයි. එන්. තිලකරත්න විසින් ලියා සහතික කරන ලද 2019.07.22 දිනැති අංක 774 සහ 2021.04.06 දිනැති අංක 866 දරන උකස් බැඳුම්කරයන් මත අයවිය යුතු ගෙවීම් කිරීම, අංගොඩ පදිංචි නිසල් චතුරංග ගෝවින්නගේ යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද,

2023 ජුනි මස 30 වැනි දිනට එකී නිසල් චතුරංග ගෝවින්නගේ යන අයගෙන් ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී වෙත ඉහත කී අංක 774 සහ 866 දරන උකස් බැඳුම්කරයන් මත රුපියල් හැත්තෑ දෙලක්ෂ හැත්තෑ පන් දහස් අටසිය හැට හතරයි ශත අසූ නවයක (රු. 7,275,864.89) මුදලක් ද, 2023 ජූලි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා රුපියල් පනස් දෙලක්ෂ විසි එක් දහස් පන්සිය අසූ පහයි ශත තිහක (රු. 5,221,585.30) මුදල මත වර්ෂයකට සියයට පහළොවයි දශම පහක් (15.5%) බැගින් වූ ස්ථිර අනුපාතය මත ගණනය කරන ලද පොළිය ද, රුපියල් දහසය ලක්ෂ පනස් එක් දහස් හතයි ශත තිස් එකක (රු. 1,651,007.31) මුදල මත වර්ෂයකට සියයට එකොළහක් (11%) බැගින් වූ ස්ථිර අනුපාතය මත ගණනය කරන ලද පොළිය ද, අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති බැවින් ද,

තව ද, එකී මුදලවන රුපියල් හැත්තෑ දෙලක්ෂ හැත්තෑ පන් දහස් අටසිය හැට හතරයි ශත අසූ නවයක (රු. 7,275,864.89) මුදලක් ද, 2023 ජූලි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා රුපියල් පනස් දෙලක්ෂ විසි එක් දහස් පන්සිය අසූ පහයි ශත තිහක (රු. 5,221,585.30) මුදල මත වර්ෂයකට සියයට පහළොවයි දශම පහක් (15.5%) බැගින් වූ ස්ථිර අනුපාතය මත ගණනය කරන ලද පොළිය ද, රුපියල් දහසය ලක්ෂ පනස් එක් දහස් හතයි ශත තිස් එකක (රු. 1,651,007.31) මුදල මත වර්ෂයකට සියයට එකොළහක් (11%) බැගින් වූ ස්ථිර අනුපාතය මත ගණනය කරන ලද පොළිය ද, හෝ විකිණීමේ අවස්ථාව දක්වා එයින් නොගෙවා ඉතිරිවී ඇති යම් කොටසක් අයකර ගැනීම සඳහා එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තියේ නියමයන් යටතේ උකස් බැඳුම්කරයන්ගේ ප්‍රඥප්ති සමග අනුකූලව ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී විසින් වැය කර ඇති සියලු මුදල් ද, ප්‍රචාරක ගාස්තු සහ අනෙකුත් අය කිරීම් ද, සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 774 සහ 866 දරන උකස් බැඳුම්කරයන් මගින් නිසල් චතුරංග ගෝවින්නගේ විසින් ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී වෙත උකස් කරන ලද පහත විස්තර කරනු ලබන ඉඩම සහ ගොඩනැගිල්ල බලයලත් වෙන්දේසිකරු ටී ඇන්ඩ් එච් ඔක්ෂන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් ඔවුන් වෙත පැවරී ඇති බලතල අනුව ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා කරයි.

*අංක 774 සහ 866 දරන උකස් බැඳුම්කරයන් මගින් උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තරය*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, දකුණ අඹතලෙන් පහළ කොටිකාවත්ත, මුල්ලේරියාව ප්‍රාදේශීය සභා බලසීමාවේ, කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 513, ගොතටුව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, ගොතටුව පිහිටි නින්දහේන පාර, වරිපනම් අංක 7/3 දරන පිටමගුරේ කුඹුර නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු සාලිය වික්‍රමසිංහ විසින් සාදන ලද 2018.12.27 දිනැති අක 15679 දරන මැනුම් පිඹුරේ ලොට් 1A වශයෙන් ලකුණු කොට බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් : උතුරට : ටී. ඩී. අමිලා රෝහිණිගේ ඉඩම සහ මෙහි ලොට් 1B ද, නැගෙනහිරට : මෙහි ලොට් 1B සහ එන්. එම්. ගොවින්නගේ ඉඩම ද, දකුණට : එන්. එම්. ගොවින්නගේ ඉඩම සහ පාර (අංක 540 දරන පිඹුරේ ලොට් 7) ද සහ බස්නාහිරටඃ පාර (අංක 540 දරන පිඹුරේ ලොට් 7) සහ ටී. ඩී. අමිලා රෝහිණිගේ ඉඩම ද වශයෙන් මායිම් වූ එකී අංක 15679 දරන පිඹුර ප්‍රකාරව ප්‍රමාණයෙන් පර්චස් හයයි දශම හයයි පහක් (පර්. 6.65) *හෙවත්* හෙ. 0.0168ක් විශාල ඉඩම එහි පිහිටි පස, ගහකොළ, ගොඩනැගිලි ඇතුලු අනෙකුත් සියලු දේ ද සමග වේ.

ඉහත කී ලොට් 1A පහත දැක්වෙන ඉඩමේ උප බෙදීමක් වේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, දකුණ අඹතලෙන් පහළ කොටිකාවත්ත, මුල්ලේරියාව ප්‍රාදේශීය සභා බලසීමාවේ, කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 513, ගොතටුව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, ගොතටුව පිහිටි නින්දහේන පාර, වරිපනම් අංක 7/3 දරන පිටමගුරේ කුඹුර නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු සාලිය වික්‍රමසිංහ විසින් සාදන ලද 2012.12.13 දිනැති අංක 12001 දරන මැනුම් පිඹුරේ ලොට් A වශයෙන් ලකුණු කොට බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් : උතුරට : ටී. ඩී. අමිලා රෝහිණිගේ ඉඩම සහ කාණුව (අංක 540 දරන පිඹුරේ ලොට් 4) ද, නැගෙනහිරට : කාණුව (අංක 540 දරන පිඹුරේ ලොට් 4) සහ මෙහි ලොට් B ද, දකුණට : මෙහි ලොට් B සහ පාර (අංක 540 දරන පිඹුරේ ලොට් 7) ද, සහ බස්නාහිරට : පාර (අංක 540 දරන පිඹුරේ ලොට් 7) සහ ටී. ඩී. අමිලා රෝහිණිගේ ඉඩම ද වශයෙන් මායිම් වූ එකී අංක 12001 දරන පිඹුර ප්‍රකාරව ප්‍රමාණයෙන් පර්චස් හතක් (පර්. 7) *හෙවත්* හෙ. 0.01777ක් විශාල ඉඩම එහි පිහිටි පස, ගහකොළ, ගොඩනැගිලි ඇතුලු අනෙකුත් සියලු දේ ද සමග වේ.

මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

පහත විස්තර කරනු ලබන පාරක් සඳහා වූ වෙන් කිරීම තුළින් මතින් හා ඔස්සේ වන මාර්ග අයිතිය ද සමග වේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, දකුණ අඹතලෙන් පහළ කොටිකාවත්ත, මුල්ලේරියාව ප්‍රාදේශීය සභා බලසීමාවේ, කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 513, ගොතටුව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, ගොතටුව පිහිටි, පිටමගුරේ කුඹුර නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු සාලිය වික්‍රමසිංහ විසින් සාදන ලද 1988.11.01 දිනැති අංක 540 දරන මැනුම් පිඹුරේ ලොට් 7 වශයෙන් ලකුණුකොට බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් : උතුරට : ලොට් 5, 6 සහ 8 ද, නැගෙනහිරටඃ ලොට් 8 සහ 9 ද, දකුණට : ලොට් 10 සහ ගණේගොඩට අයත් ඉඩම ද සහ බස්නාහිරට : ගණේගොඩට අයත් ඉඩම සහ බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. කාර්තිගේසු විසින් සාදන ලද අංක 1244 දරන පිඹුරේ දැක්වෙන ලොට් 4 ද වශයෙන් මායිම් වූ එකී අංක 540 දරන පිඹුර ප්‍රකාර ප්‍රමාණයෙන් පර්චස් නවයයි දශම දෙකකයි බිංදුවක් (පර්. 9.20) *හෙවත්* හෙ. 0.01777ක් විශාල ඉඩම වේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

බලයලත් මිනින්දෝරු සාලිය වික්‍රමසිංහ විසින් සාදන ලද 2018.12.27 දිනැති අංක 15679 දරන මැනුම් පිඹුරේ ලොට් 1B වශයෙන් ලකුණු කරන ලද ඇල ඔස්සේවන වෙන් කිරීම ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්,
ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී.

01-26

---

**ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී විසින් සම්මත කරගන්නා ලද යෝජනාව පිළිබඳ දැන්වීමයි

ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනාව 2023 නොවැම්බර් මස 29 වැනි දින ඒකමතිකව සම්මත කරගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාව

(ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී හි අනුප්‍රාප්තික) ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී නමට ප්‍රසිද්ධ නොතාරිස් චාන්දනී දයාරත්න විසින් ලියා සහතික කරන ලද 2014.06.20 දිනැති අංක 8868

සහ 2015.05.07 දිනැති අංක 9676 දරන උකස් බැඳුම්කරයන් මත අයවිය යුතු ගෙවීම් කිරීම, සිය ලියාපදිංචි කාර්යාලය මීගමුවේ පවත්වාගෙන යන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සමාගම් පනත යටතේ යථා පරිදි ලියාපදිංචි කරන ලද PV75121 දරන හොටෙල් රේන්බෝ (ප්‍රයිවෙට්) ලිමිටඩ් (මෙහි මින්මතු "සමාගම" යනුවෙන් හඳුන්වනු ලබන) විසින් පැහැර හැර ඇති හෙයින් ද,

2023 අගෝස්තු මස 31 වැනි දිනට එකී හොටෙල් රේන්බෝ (ප්‍රයිවෙට්) ලිමිටඩ් වෙතින් ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී වෙත ඉහත කී අංක 8868 සහ 9676 දරන උකස් බැඳුම්කරයන් මත රුපියල් දෙකෝටි තිස් එක් ලක්‍ෂ තුන් දහස් හාරසිය හතළිහයි ශත අසූ නවයක (රු. 23,103,440.89) මුදලක් ද, 2023 සැප්තැම්බර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා රුපියල් විසි හතර ලක්‍ෂ දහ අට දහස් එකසිය පනස් නවයයි ශත හැත්තෑ දෙකක (රු. 2,418,159.72) මුදල මත පවත්නා අනුපාතය අනුව සෑම වර්ෂයකම සෑම තුන් මාසයකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි හා ඔක්තෝබර් මාසවල වැඩ කරන පළමුවන දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන සාමාන්‍ය බර තැබූ මධ්‍ය මූලික ණය පොළී අනුපාතයට (AWPR SPOT) ඉහළින් වර්ෂයකට සියයට හතරක් (4%) බැගින් වූ අනුපාතය මත ගණනය කරනලද පොළිය ද, රුපියල් හැට හත් ලක්‍ෂ හැට හත් දහස් හාරසිය දහ හතරයි ශත අසූ හයක (රු. 6,767,414.86) මුදල මත වර්ෂයකට සියයට අටයි දශම එකයි එකක් (8.11%) බැගින් වූ අනුපාතය මත ගණනය කරන ලද පොළිය ද, රුපියල් පන් ලක්‍ෂ හතළිස් පන් දහස් හාරසිය තිස් දෙකයි ශත දහ හතක (රු. 545,432.17) මුදල මත වර්ෂයකට සියයට දහ හතයි දශම පහක් (17.5%) බැගින් වූ අනුපාතය මත ගණනය කරන ලද පොළිය ද සහ රුපියල් එක් කෝටි විසි හය ලක්‍ෂ හය දහසයි ශත හතළිහක (රු. 12,606,000.40) මුදල මත වර්ෂයකට සියයට දහ නවයක් (19%) බැගින් වූ අනුපාතය මත ගණනය කරන ලද පොළිය ද යුතුව සහ ලැබිය යුතුව ඇති බැවින් ද,

තව ද, එකී මුදල වන රුපියල් දෙකෝටි තිස් එක් ලක්‍ෂ තුන් දහස් හාරසිය හතළිහයි ශත අසූ නවයක (රු. 23,103,440.89) මුදලක් ද, 2023 සැප්තැම්බර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා රුපියල් විසි හතර ලක්‍ෂ දහ අට දහස් එකසිය පනස් නවයයි ශත හැත්තෑ දෙකක (රු. 2,418,159.72) මුදල මත පවත්නා අනුපාතය අනුව සෑම වර්ෂයකම සෑම තුන් මාසයකට වරක් එනම්, ජනවාරි, අප්‍රේල්, ජූලි හා ඔක්තෝබර් මාසවල වැඩ කරන පළමුවන දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන සාමාන්‍ය බර තැබූ මධ්‍ය මූලික ණය පොළී අනුපාතයට (AWPR SPOT) ඉහළින් වර්ෂයකට සියයට හතරක් (4%) බගින් වූ අනුපාතය මත ගණනය කරන ලද පොළිය ද, රුපියල් හැට හත් ලක්‍ෂ හැට හත් දහස් හාරසිය දහ හතරයි ශත අසූ හයක (රු. 6,767,414.86) මුදල මත වර්ෂයකට සියයට අටයි දශම එකයි එකක් (8.11%) බැගින් වූ අනුපාතය මත ගණනය කරන ලද පොළිය ද, රුපියල් පන් ලක්‍ෂ හතළිස් පන් දහස් හාරසිය තිස් දෙකයි ශත දහ හතක (රු. 545,432.17) මුදල මත වර්ෂයකට සියයට දහ හතයි දශම පහක් (17.5%) බැගින් වූ අනුපාතය මත ගණනය කරන ලද පොළිය ද සහ රුපියල් එක් කෝටි විසි හය ලක්ෂ හය දහසයි ශත හතළිහක (රු. 12,606,000.40) මුදල මත වර්ෂයකට සියයට දහ නවයක් (19%) බැගින් වූ අනුපාතය මත ගණනය කරනු ලබන පොළිය ද, හෝ විකිණීමේ අවස්ථාව දක්වා එයින් නොගෙවා ඉතිරිවී ඇති යම් කොටසක් අයකර ගැනීම සඳහා එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තියේ නියමයන් යටතේ උකස් බැඳුම්කරයන්ගේ ප්‍රඥප්ති සමග අනුකූලව ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී විසින් වැය කර ඇති සියලුම මුදල් ද, ප්‍රචාරක ගාස්තු සහ අනෙකුත් අය කිරීම් ද, සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 8868 සහ 9676 දරන උකස් බැඳුම්කරයන් මගින් ලලිත් අමල් සැමුවෙල් රූපසිංහ *හෙවත්* ලලිත් අමල් සැමුවෙල් රූපසිංහ (Lalith Amal Samuel Rupasinghe *alias* Lalith Amal Samuwel Rupasinghe) විසින් ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී වෙත උකස් කරනලද පහත විස්තර කරනු ලබන ඉඩම සහ ගොඩනැගිල්ල බලයලත් වෙන්දේසිකරු තුසිත් කරුණාරත්න ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් ඔවුන් වෙත පැවරී ඇති බලතල අනුව ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී හි අධ්‍යක්‍ෂ මණ්ඩලය මෙයින් යෝජනා කරයි.

*අංක 8868 සහ 9676 දරන උකස් බැඳුම්කරයන් මගින් උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තරය*

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ලියාපදිංචි කොට්ඨාසයේ, මීගමුව මහ නගර සභා සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 158 වේල්ල වීදිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ඒත්තුකාල වඩාත් නිවැරදිව කුඩාපාඩුව කැරන් පෙදෙස, වරිපනම් අංක 03 දරන "පූනයිමරතඩිතෝට්ටම් *හෙවත්* දොඹගහවත්ත *හෙවත්* සී. බ්‍රීෆ්ට්" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ජේ. එම්. ජී. ඩයස් විසින් සාදන ලද 2001.04.26 දිනැති අංක 2795C දරන එම මිනින්දෝරුවරයා විසින්ම 2014.04.08 නැවත සහතික කරන ලද පිඹුරේ දැක්වෙන බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් : උතුරට : පාර ද, නැගෙනහිරට : නෝබට් පෙරේරාගේ ඉඩම ද, දකුණට: සෙනෙවිරත්නගේ ඉඩම සහ සන්සෙට් බීච් හොටෙල් (ප්‍රයිවෙට්) ලිමිටඩ් ද, සහ බස්නාහිරට : සන්සෙට් බීච් හොටෙල් (ප්‍රයිවෙට්) ලිමිටඩ් ද වශයෙන් මායිම් වූ ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් විසි හතරයි දශම එකයි බිංදුවක් (රූ.1, පර්. 24.10) *හෙවත්* හෙ. 0.6121ක් විශාල ඉඩම එහි පිහිටි සියලු දේ ද සමග වේ. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්,
ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී.

01-25

## නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී

### සංශෝධිත 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබූ යෝජනා සම්මතය

2023 ජූලි මස 18 දින පවත්වන ලද නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක දී පහත සඳහන් යෝජනා සම්මතය විශේෂයෙන් ම සහ ඒකමතිකව සම්මත කරන ලදී; එනම්,

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී (බැංකුව) ආයතනය වෙනුවෙන් කුලියාපිටිය ප්‍රසිද්ධ නොතාරිස් ජයකොඩි රාලලාගේ නෙලුම් චම්පිකා ජයකොඩි විසින් සහතික කරන ලද 2020.02.26 දින අංක 3492 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කර පවරා දෙන ලද මෙහි උපලේඛනයේ සවිස්තරාත්මකව විස්තරකර ඇති දේපළ සහ පරිශ්‍රය ඇපයට තබා එයට එරෙහිව ප්‍රදානය කරන ලද ණය මුදල්/ පහසුකම් මත අයවිය යුතු මුදල් ගෙවීම ("පළමු ණයගැණුම්කරුවන") කුලියාපිටියේ ස්වකීය ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇත්තා වූ ද, අංක PV 00215376 දරන ලියාපදිංචි අංකය යටතේ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාගත කර ඇති සමාගමක්වන සුනිල් විජේතුංග ඇන්ඩ් සන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන ආයතනය විසින් සහ ("දෙවන ණයගැණුම්කරු වන") කුලියාපිටිය පදිංචි විජේතුංග මුදලිගේ රාජිත කසුන් විජේතුංග යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද;

පහත විස්තර කර ඇති දේපළෙහි සහ පරිශ්‍රයෙහි බදු ගෙවීමෙන් නිදහස් සින්නක්කර අයිතිකරුවන දෙවන ණයගැණුම්කරු විසින් ස්වකීය බදු ගෙවීමෙන් නිදහස් සින්නක්කර අයිතිය, හිමිකම සහ සම්බන්ධතාවය ඉහත කී අංක 3492 දරන උකස් බැඳුම්කරය යටතේ බැංකුව වෙත උකස්කර ඇති හෙයින් ද;

2023 මාර්තු මස 26 දිනය වනවිට ඉහත කී අංක 3492 දරන උකස් බැඳුම්කරය මත ඉහත කී බැංකුව වෙත රුපියල් මිලියන විසිපහයි දෙලක්ෂ තිස්හතර දහස් අටසිය පනස් හයයි ශත දහතුනක් වූ මුදලක් (රු. 25,234,856.13) ලැබිය යුතුව සහ අයවිය යුතුව පවතින හෙයින් ද;

අනතුරුව කිසියම් ගෙවීමක් (සිදුකර ඇත්නම්) එම ගෙවීම අඩු කිරීමෙන් පසුව ප්‍රධාන පනතේ 13 වන වගන්තිය ප්‍රකාරව දරන ලද ප්‍රචාරක පිරිවැය, විකුණුම් පිරිවැය සහ වෙනත් යම් ගාස්තු ද සමග ඉහත කී රුපියල් මිලියන විසිපහයි දෙලක්ෂ තිස්හතර දහස් අටසිය පනස් හයයි ශත දහතුනක් වූ (රු. 25,234,856.13) මුදල හෝ දේපළ වෙන්දේසි දිනය වන විට නොගෙවා ඉතිරිව පවතින එහි යම් කොටසක් සහ

(i) 2023 මාර්තු මස 27 දින සිට වෙන්දේසි දිනය තෙක් වර්ෂයකට සියයට දාසයයි දශම එකයි බිංදුවක් වූ (16.10%) අනුපාතිකය යටතේ ඉහත කී අංක 3492 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු රුපියල් මිලියන විස්සයි අටලක්ෂ තිස්තුන්දහස් තුන්සියයක් වූ (රු. 20,883,300.00) මුදලක් මත පොළිය ද අයකර ගැනීම සඳහා,

ඉහත කී ණයමුදල්/ පහසුකම් සඳහා ඇපකරයක් වශයෙන් බැංකුව වෙත උකස්කරන ලද පහත විස්තරකර ඇති දේපළෙහි සහ පරිශ්‍රයෙහි සින්නක්කර අයිතිය, වෙනත් යම් අයිතිවාසිකම්, හිමිකම් සහ සම්බන්ධතා ඇතුළත්වන එම දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර එන්. යූ. ජයසූරිය මහතා මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත (ප්‍රධාන පනත) යටතේ තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර බැංකු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මතකර සිටිනු ලැබේ.

### පළමු උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව මහනගර සභා සීමාව තුළ මීගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 160/A, තලදූව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, බෝලවලාන 1 වන කොට්ඨාසයේ පිහිටා ඇත්තා වූ ද ශාන්ත ජූඩ් පෙදෙස, වරිපනම් අංක 10/1 දරන "තල්ගහවත්ත" *හෙවත්* "සීයවත්ත" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු ජේ. ඒ. රෝහිත ජයලත් විසින් සාදන ලද 2020.01.23 දින අංක 2856 දරන පිඹුරේ ලොට් අංක 1 ලෙස ලකුණුකර නිරූපණයකර ඇත්තා වූ ද,

*උතුරට* :- වර්තමානයේ දී කොඩිකාර යන අය විසින් හිමිකම් කියනු ලබන තල්ගහවත්ත ඉඩමේ ලොට් B ද;

*නැගෙනහිරට* :- ශාන්ත ජූඩ් පෙදෙස, වරිපනම් අංක 10 දරන පරිශ්‍රය වන එච්. ජේ. බස්නායක යන අය විසින් හිමිකම් කියනු ලබන ලොට් අංක 1A දරන ඉඩමේ ඉතිරි කොටස ද;

*දකුණට* :- ශාන්ත ජූඩ් පෙදෙස, වරිපනම් අංක 10 දරන පරිශ්‍රය වන ලින්ඩා පෙරේරා යන අය විසින් හිමිකම් කියන එම ඉඩමේම කොටසක් සහ මැනුවෙල් පෙරේරා යන අය විසින් හිමිකම් කියන වරිපනම් අංක

12 දරන ඉඩමේම කොටසක් සහ ලොට් අංක 2 ද; සහ

*බටහිරට* :- ශාන්ති ප්‍රනාන්දු සහ වෙනත් අය විසින් හිමිකම් කියන ඉඩම ද;

යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද ප්‍රමාණයෙන් පර්චස් තිහයි දශම හතරයි දෙකක් වූ ද (පර්. 30.42) ලොට් අංක 1 දරන ඉහත කී බෙදා වෙන්කළ ඉඩම් කොටස සහ ඒ මත වූ ගහකොළ, වගාවන් සහ වෙනත් සියලු දේ ද වේ.

ඉහත කී ලොට් අංක 1 දරන ඉඩම් කොටස පහත සවිස්තරාත්මකව විස්තරකර ඇති ලොට් අංක 1A1 දරන ඉඩමේ නැවත මැනීමක් වේ; එනම් -

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව මහනගර සභා සීමාව තුළ මීගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 160/A, තලදූව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, බෝල්වලාන 1 වන කොට්ඨාසයේ පිහිටා ඇත්තා වූ ද ශාන්ත ජූඩ් පෙදෙස, වරිපනම් අංක 10/1 දරන "තල්ගහවත්ත" *හෙවත්* "සීයවත්ත" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු ආර්. ඒ. චන්ද්‍රරත්න විසින් සාදන ලද 2000.06.25 දින අංක 1960 දරන පිඹුරේ ලොට් අංක 1A1 ලෙස ලකුණුකර නිරූපණය කර ඇත්තා වූ ද,

*උතුරට* :- කොඩිකාර යන අය විසින් වර්තමානයේ දී හිමිකම් කියනු ලබන තල්ගහවත්ත ඉඩමේ ලොට් B ද;

*නැගෙනහිරට* :- ශාන්ත ජූඩ් පෙදෙස, වරිපනම් අංක 10 දරන පරිශ්‍රය වන එච්. ජේ. බස්නායක යන අය විසින් හිමිකම් කියනු ලබන ලොට් අංක 1A දරන ඉඩමේ ඉතිරි කොටස ද;

*දකුණට* :- ලොට් අංක 1A 2, ශාන්ත ජූඩ් පෙදෙස, වරිපනම් අංක 12 දරන පරිශ්‍රය වන මැනුවෙල් සිල්වා යන අයට අයත් එම ඉඩමේම කොටසක් සහ ශාන්ත ජූඩ් පෙදෙස, වරිපනම් අංක 16 දරන පරිශ්‍රය වන ලින්ඩා පෙරේරා යන අයට අයත් එම ඉඩමේ ම කොටසක් ද;

*බටහිරට* :- ශාන්ති ප්‍රනාන්දු සහ වෙනත් අය විසින් හිමිකම් කියන ඉඩම ද;

යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද ප්‍රමාණයෙන් පර්චස් තිහයි දශම හතරයි දෙකක් වූ ද (පර්. 30.42) මීගමුව ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ G 293/13 දරන වෙලුමේ/පත්තිරුවේ ලියාපදිංචි වී ඇති ඉහත කී ලොට් අංක 1A1 දරන බෙදා වෙන්කළ ඉඩම් කොටස ඒ මත වූ ගහකොළ, වගාවන් සහ වෙනත් සියලු දේ ද වේ.

පහත සඳහන් ඉඩම් කොටස හරහා යෑමේ ඒමේ මාර්ග පරවශතා අයිතියද සමග වේ; එනම් -

1. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව මහනගර සභා සීමාව තුළ මීගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 160/A, තලදූව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, බෝල්වලාන, 1 වන කොට්ඨාසයේ පිහිටා ඇත්තා වූ ද, ශාන්ත ජූඩ් පෙදසෙ, වරිපනම් අංක 10/1 දරන "තල්ගහවත්ත" *හෙවත්* "සීයවත්ත" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු ජේ. ඒ. රෝහිත ජයලත් විසින් සාදන ලද 2020.01.23 දින අංක 2856 දරන පිඹුරේ ලොට් අංක 2 ලෙස ලකුණුකර නිරූපණයකර ඇත්තා වූ ද,

*උතුරට* :- ලොට් අංක 1 ද;

*නැගෙනහිරට* :- ශාන්ත ජූඩ් පෙදෙස, වරිපනම් අංක 10 දරන පරිශ්‍රය වන එච්. ජේ. බස්නායක යන අය විසින් හිමිකම් කියනු ලබන ලොට් අංක 1A දරන ඉඩමේ ඉතිරි කොටස ද;

*දකුණට* :- ලොට් අංක 3 ද;

*බටහිරට* :- ශාන්ත ජූඩ් පෙදෙස, වරිපනම් අංක 12 දරන පරිශ්‍රය වන මැනුවල් සිල්වා විසින් හිමිකම් කියන එම ඉඩමේම ඉතිරි කොටස ද;

යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද ප්‍රමාණයෙන් පර්චස් එකයි දශම අටයි බිංදුවක් වූ ද (පර්. 1.80) ඉහත කී ලොට් අංක 2 දරන බෙදා වෙන්කළ ඉඩම් කොටස සහ ඒ මත වූ ගහකොළ, වගාවන් සහ වෙනත් සියලු දේ ද වේ.

ඉහත කී ලොට් අංක 2 දරන ඉඩම් කොටස පහත සවිස්තරාත්මකව විස්තර කර ඇති ලොට් අංක 1A2 දරන ඉඩමේ නැවත මැනීමක් වේ; එනම් -

1. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව මහනගර සභා සීමාව තුළ මීගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 160/A, තලදූව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, බෝල්වලාන, 1 වන කොට්ඨාසයේ පිහිටා ඇත්තා වූ ද, ශාන්ත ජූඩ් පෙදසෙ, වරිපනම් අංක 10/1 දරන "තල්ගහවත්ත" *හෙවත්* "සීයවත්ත" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු ආර්. ඒ. චන්ද්‍රරත්න විසින් සාදන ලද 2000.06.25 දින අංක 1960 දරන පිඹුරේ ලොට් අංක 1A2 ලෙස ලකුණුකර නිරූපණයකර ඇත්තා වූ ද,

*උතුරට* :- ලොට් අංක 1A1 ද;

*නැගෙනහිරට* :- ශාන්ත ජුඩ් පෙදෙස, වරිපනම් අංක 10 දරන පරිශ්‍රය වන එච්. ජේ. බස්නායක විසින් හිමිකම් කියනු ලබන ලොට් අංක 1A දරන ඉඩමේ ඉතිරි කොටස ද;

*දකුණට* :- ලොට් අංක 1B1 ද;

*බටහිරට* :- ශාන්ත ජුඩ් පෙදෙස, වරිපනම් අංක 12 දරන පරිශ්‍රය වන මැනුවල් සිල්වා විසින් හිමිකම් කියන එම ඉඩමේම ඉතිරි කොටස ද;

යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද ප්‍රමාණයෙන් පර්චස් එකයි දශම අටයි බිංදුවක් වූ ද (පර්. 1.80) මීගමුව ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ G 293/14 දරන වෙලුමේ/පත්තිරුවේ ලියාපදිංචි වී ඇති ඉහත කී ලොට් අංක "1A2" දරන බෙදා වෙන්කළ ඉඩම් කොටස ඒ මත වූ ගහකොළ, වගාවන් සහ වෙනත් සියලු දේ ද වේ.

2. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව මහනගර සභා සීමාව තුළ මීගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 160/A, තලදූව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, බෝල්වලාන, 1 වන කොට්ඨාසයේ පිහිටා ඇත්තා වූ ද, ශාන්ත ජුඩ් පෙදෙසෙ, වරිපනම් අංක 10/1 දරන "තල්ගහවත්ත" *හෙවත්* "සීයවත්ත" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු ජේ. ඒ. රෝහිත ජයලත් විසින් සාදන ලද 2020.01.23 දින අංක 2856 දරන පිඹුරේ ලොට් අංක 3 ලෙස ලකුණුකර නිරූපණයකර ඇත්තා වූ ද,

*උතුරට* :- ලොට් අංක 2 ද;

*නැගෙනහිරට* :- එච්. ජේ. බස්නායක විසින් හිමිකම් කියනු ලබන ලොට් අංක 1B දරන ඉඩමේ ඉතිරි කොටස ද;

*දකුණට* :- තලදූව පාර ද;

*බටහිරට* :- ශාන්ත ජුඩ් පෙදෙස, වරිපනම් අංක 12 දරන පරිශ්‍රය වන මැනුවල් සිල්වා විසින් හිමිකම් කියන එම ඉඩමේම ඉතිරි කොටස ද;

යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද ප්‍රමාණයෙන් පර්චස් හතරයි දශම හයයි පහක් වූ ද (පර්. 4.65) ඉහත කී ලොට් අංක 3 දරන බෙදා වෙන්කළ ඉඩම් කොටස සහ ඒ මත වූ ගහකොළ, වගාවන් සහ වෙනත් සියලු දේ ද වේ.

ඉහත කී ලොට් අංක 3 දරන ඉඩම් කොටස පහත සවිස්තරාත්මකව විස්තර කර ඇති ලොට් අංක 1B1 දරන ඉඩමේ නැවත මැනීමක් වේ; එනම් -

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව මහනගර සභා සීමාව තුළ මීගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 160/A, තලදූව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, බෝල්වලාන, 1 වන කොට්ඨාසයේ පිහිටා ඇත්තා වූ ද, ශාන්ත ජුඩ් පෙදසෙ, වරිපනම් අංක 10/1 දරන "තල්ගහවත්ත" *හෙවත්* "සීයවත්ත" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා බලයලත් මිනින්දෝරු ආර්. ඒ. චන්ද්‍රරත්න විසින් සාදන ලද 2000.06.25 දින අංක 1960 දරන පිඹුරේ ලොට් අංක 1B1 ලෙස ලකුණුකර නිරූපණය කර ඇත්තා වූ ද,

*උතුරට* :- ලොට් අංක 1A2 ද;

*නැගෙනහිරට* :- එච්. ජේ. බස්නායක විසින් හිමිකම් කියනු ලබන ලොට් අංක 1B දරන ඉඩමේ ඉතිරි කොටස ද;

*දකුණට* :- තලදූව පාර ද;

*බටහිරට* :- ශාන්ත ජුඩ් පෙදෙස, වරිපනම් අංක 12 දරන පරිශ්‍රය වන මැනුවල් සිල්වා විසින් හිමිකම් කියන එම ඉඩමේම ඉතිරි කොටස ද;

යන මායිම් තුළ පිහිටා ඇත්තා වූ ද ප්‍රමාණයෙන් පර්චස් හතරයි දශම හයයි පහක් වූ ද (පර්. 4.65) මීගමුව ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ G 293/15 දරන වෙලුමේ/පත්තිරුවේ ලියාපදිංචි වී ඇති ඉහත කී ලොට් අංක 1B1 දරන බෙදා වෙන්කළ ඉඩම් කොටස ඒ මත වූ ගහකොළ, වගාවන් සහ වෙනත් සියලු දේ ද වේ.

තව ද, උපකරණ සමග විදුලි සැපයුම් පද්ධතිය, ජල සැපයුම් පද්ධතිය, විදුලි සංදේශ උපකරණ සහ වායු සමීකරණ උපකරණ ඇතුළු ඉහත සවිස්තරාත්මකව විස්තරකර ඇති ඉහත කී ඉඩම් කොටසට දැනට හෝ මෙහි මින්මතු කලින් කලට එකතු කරනු ලැබිය හැකි හෝ ස්ථිරව සවි කරනු ලැබිය හැකි වූ, එක්ව හා වෙන් වෙන් වශයෙන් වූ සියලු නිශ්චල යන්ත්‍රාගාර සහ යන්ත්‍රෝපකරණ, උපකරණ, සවිතුරු, සවිකිරීම් ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්,
නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී.

01-60

## ලංකා බැංකුව - කැකිරාව ශාඛාව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම

2023 නොවැම්බර් මස 08 දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන් ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ඩී. එස්. කේ. නරසිංහ විසින් සහතික කරන ලද 2019.05.28 දිනැති අංක 258 දරන උකස් බැඳුම්කරය අනුව ණය පහසුකම මත 2023.09.26 දිනය තෙක් මුල් මුදල හා පොළිය වශයෙන් රු. 20,525,688.89ක (රුපියල් මිලියන විස්සයි පන්සිය විසිපන් දහස් හයසිය අසූ අටයි ශත අසූ නවයක්) මුදලක් සමග මුල් මුදලේ ශේෂය රු. 12,000,000.00 (රුපියල් මිලියන දොළහක්) මත වසරකට සියයට විසිනවයක් (29%) බැගින් 2023.09.27 දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් තවදුරටත් පොළිය ද, කැකිරාව, පළුගස්වැව, දෙමුන්නෑව, හෝම් සීස් රයිස් මිල් හි රාජපක්ෂ කරුණානායක හේරත් බණ්ඩාරලාගේ උදයංගනී හේරත් මහත්මිය සහ (නැසීගිය) හේරත් බණ්ඩාරලාගේ සේනාරත්න බණ්ඩාර මහතා යන අයගෙන් අයවිය යුතුව ඇත.

2. ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ඩී. එස්. කේ. නරසිංහ විසින් සහතික කරන ලද 2019.05.28 දිනැති අංක 258 දරන උකස් බැඳුම්කරය අනුව ණය පහසුකම මත 2023.09.26 දිනය තෙක් මුල් මුදල හා පොළිය වශයෙන් රු. 20,525,688.89ක (රුපියල් මිලියන විස්සයි පන්සිය විසිපන් දහස් හයසිය අසූ අටයි ශත අසූ නවයක්) මුදලක් ද 2023.09.27 දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත සඳහන් පරිදි තවදුරටත් පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද, අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළොන්නාව, විහාර මාවත, අංක 50/3, T&H ඔක්ෂන්ස් හි වෙන්දේසිකාර M. H. T. කරුණාරත්න මහතාහට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වන වගන්තිය යටතේ ද ලංකා බැංකු ආඥාපනතේ 21 වන වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුවේ කැකිරාව ශාඛාවේ කළමනාකාර මහත්මිය හට ද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

#### පළමු උපලේඛනය

1. උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, පළුගස්වැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හා කැකිරාව ප්‍රාදේශීය සභා සීමාවේ, මතම්භුව කෝරළයේ, දෙමුන්නෑව, අංක 594 දරන ග්‍රාමසේවා නිලධාරි කොට්ඨාසයේ, (නමුත් දෙබුක්කෑව යනුවෙන් ලියාපදිංචි කර ඇති) දෙබුක්කෑව ග්‍රාමය ලෙස ලියාපදිංචි නමුත් දෙමුන්නෑව ග්‍රාමයේ පිහිටි "රජයේ ඉඩම"නමැති ඉඩම් කැබැල්ල, උතුරට : කේ. එම්. සෝමපාලගේ ඉඩම ද, නැගෙනහිරට : ප්‍රධාන පාරේ වෙන්කිරීම් ද, දකුණට: එම්. බී. ජයතිලකගේ ඉඩම ද, බස්නාහිරට : දෙමුන්නෑව වැංකියට වෙන්කළ කොටස ද මායිම්ව අක්කර එකක් (අ.1) ක බිම් ප්‍රමාණය සමග එහි පිහිටි ගහකොළ, වැවිලි, ගොඩනැගිලි සහ සියලු දේ සමග වේ. මෙම ඉඩම අනුරාධපුර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ L. D. O. X 05/42 හි ලියාපදිංචි කර ඇත.

එකී ඉඩම බලයලත් මිනින්දෝරු කේ. වී. සෝමපාල විසින් සාදන ලද 2001.03.16 දිනැති අංක 3675 දරන මිනුම් පිඹුරට අනුව පහත සඳහන් පරිදි විස්තර කර ඇත.

එකී දෙමුන්නෑව ග්‍රාමයේ පිහිටි "ස්ටේට් ලැන්ඩ් හෙවත් ඉඩම" නමැති ඉඩම බලයලත් මිනින්දෝරු කේ. වී. සෝමපාල විසින් සාදන ලද 2001.03.16 දිනැති අංක 3675 දරන පිඹුරේ මායිම් නිරූපණය කළ ලොට් අංක 1 ලෙස ලකුණු කළ ඉඩම් කැබැල්ල එකී ලොට් 1, උතුරට : කේ. එම්. සෝමපාලගේ ඉඩම ද, නැගෙනහිරට : පාර ද, දකුණට : එම්. බී. ජයතිලකගේ ඉඩම ද, බස්නාහිරට : දෙමුන්නෑව වැංකියට වෙන්කළ කොටස ද මායිම්ව අක්කර එකක් (අ.1) හෝ හෙක්ටෙයාර බිංදුවයි දශම හතරයි බිංදුවයි හතරයි හතක් (හෙක්. 0.4047) බිම් ප්‍රමාණය සමග එහි පිහිටි ගහකොළ, වැවිලි, ගොඩනැගිලි සහ සියලු දේ සමග වේ.

#### දෙවන උපලේඛනය

*වෙන් කිරීම් :*

1. සියලු ඛනිජ (ඔප්පුවේ මෙම යෙදුමට වටිනා ගල් ද ඇතුළත් වේ.) පිළිබඳ හිමිකම සහ ඒවා හෑරීම සෙවීම ඒ සම්බන්ධව වැඩ කිරීම සහ එවැනි ඛනිජ බැහැර කිරීම යනාදී අයිතීන් රජය සතු ය.

2. මෙම ඉඩමට අයිතිකරුවන් සතු හිමිකම වන්නේ මෙම ප්‍රදානයේ දිනයේ සිට පාරේ අයිතිය හා පවත්නා වෙනත් පරවශ්‍යතාවන්ට යටත්වයි.

*කොන්දේසි :*

1. අයිතිකරු විසින් ගොඩ ඉඩමෙන් මෙහි නිශ්චිතව දක්වා ඇති අක්කර 1/4 මඩ ඉඩමෙන් අක්කර/හෙක්ටෙයාර ............. කට වඩා අඩු උප බෙදුම් ඒකකයක් බැහැර නොකළ යුතු ය.

2. අයිතිකරු විසින් මෙහි ...... ලෙස නම් කොට නිශ්චිතව දක්වා ඇති ඉඩම් කොටසකට වඩා අඩු නොබෙදූ කොටසක් බැහැර නොකළ යුතු ය.

3. කිසිවකුට ඉහත කොන්දේසි 1හි නිශ්චිතව දක්වා ඇති උප බෙදීම් ඒකකයකට වඩා ප්‍රමාණයෙන් අඩු බෙදන ලද කොටසකට අයිතිකරුවකු විය නොහැක.

4. කිසිවකුට ඉහත කොන්දේසි 2හි නිශ්චිතව දක්වා ඇති උප බෙදීම් ඒකකයකට වඩා ප්‍රමාණයෙන් අඩු අවම නොබෙදූ කොටසක අයිතිකරුවකු විය නොහැක.

5. ඉඩමට හෝ එහි කිසියම් කොටසකට ජලය සැපයිය හැකි නම් හෝ දැනටමත් ඉදිකර ඇති යම් වාරි මාර්ග කාර්යයක් ඉදිකිරීමක් හෝ ඉදිකිරීමට ඇති යමක් හේතුවෙන් ජලය සැපයිය හැකි බවට පත්වන්නේ නම් හෝ එම ජලය සැපයිය හැකි ප්‍රදේශය සම්බන්ධයෙන් අයිතිකරු වාරිමාර්ග ආඥාපනතේ (453 වගන්තිය) ඇති ප්‍රතිපාදනවලට අනුකූලව කටයුතු කළ යුතු ය.

6. දිසාපතිගෙන් ලිඛිත අවසරයක් සහ අදාළ අධිකාරිගෙන් බලපත්‍රයක් ලබා නොගෙන එම ඉඩම මත හෝ ඒ තුළ ඇති කිසිදු ඛනිජ ද්‍රව්‍යයක් හැරීම සෙවීම භාවිතයට ගැනීම විකිණීම හෝ අන් ආකාරයකින් බැහැර කිරීම අයිතිකරු විසින් නොකළ යුතු ය.

7. ප්‍රාදේශීය ලේකම්ගේ පූර්ව අනුමැතිය ලිඛිතව ලබා නොගෙන මෙම ඉඩම හෝ එහි ඕනෑම කෙටසක් බැහැර නොකළ යුතු යුතු ය.

ලංකා බැංකු අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එච්. එස්. ඩබ්ලිව්. සිරිවර්ධන.

2023 නොවැම්බර් මස 22 වැනි දින.
ලංකා බැංකුව,
කැකිරාව ශාඛාව.

01-41

---

**ලංකා බැංකුව - කිරිබත්ගොඩ අධිශ්‍රේණි ශාඛාව**

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන පනතින් හා 2000 අංක 54 දරන පනතින් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම

2023.11.21 දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන් ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් පී. ඩී. සමන්මලි විසින් සහතික කරන ලද 2021.06.11 දිනැති අංක 237 දරන උකස් බැඳුම්කරය අනුව 1 වන ණය මත 2023.09.25 දිනය තෙක් මුල් මුදල හා පොළිය වශයෙන් රු. 12,372,234.03ක (රුපියල් එක් කෝටි විසිතුන් ලක්ෂ හැත්තෑ දෙදහස් දෙසිය තිස්හතරයි ශත තුනක්) මුදලක් සමග රු. 9,857,130.00 ක (රුපියල් අනූඅට ලක්ෂ පනස් හත් දහස් එකසිය තිහක්) මත වසරකට සියයට විසිහතයි දශම හතයි පහක් (27.75%) බැගින් 2023.09.26 දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් තවදුරටත් පොළිය ද, 2 වන ණය මත 2023.09.25 දිනය තෙක් මුල් මුදල හා පොළිය වශයෙන් රු. 2,448,733.89ක (රුපියල් විසි හතර ලක්ෂ හතළිස් අට දහස් හත්සිය තිස්තුනයි ශත අසූ නවයක්) මුදලක් සමග රු. 2,097,663.78ක (රුපියල් විසිලක්ෂ අනූහත් දහස් හයසිය හැටතුනයි ශත හැත්තෑඅටක්) මත වසරකට සියයට පහළොවයි දශම පහයි බිංදුවක් (15.50%) බැගින් 2023.09.26 දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් තවදුරටත් පොළිය ද, මාකොල, තලවතුහේන්පිට දකුණ, අංක 226/3 හි පිහිටි ඩෙක්ස් වූ ඩෙක්ස් ඩිලිවරි සොලුෂන් හි හවුල්කරුවන් වන) නෙත්තිකුමාරගේ අමල් චතුරංග ෆොන්සේකා මහතා සහ සූරිය බණ්ඩාරගේ දොන් ඉනසන්ට් ඩොල්ටන් ජානක මහතා යන අයවලුන්ගෙන් අය විය යුතුව ඇත.

2. එකී 2021.06.11 දිනැති අංක 237 දරන උකස් බැඳුම්කරය අනුව 1 වන ණය මත රු.12,372,234.03ක (රුපියල් එක් කෝටි විසිතුන් ලක්ෂ හැත්තෑ දෙදහස් දෙසිය තිස්හතරයි ශත තුනක්) මුදලක් ද, 2 වන ණය මත රු. 2,448,733.89ක (රුපියල් විසි හතර ලක්ෂ හතළිස් අට දහස් තිස්තුනයි ශත අසූ නවයක්) මුදලක් ද 2023.09.26 දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත සඳහන් පරිදි තවදුරටත් පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද, අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළොන්නාව, විහාර මාවත, අංක 50/3, T&H ඔක්ෂන්ස් හි වෙන්දේසිකාර M. H. T. කරුණාරත්න මහතා හට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වන වගන්තිය යටතේ ද ලංකා බැංකු ආඥාපනතේ 21 වන වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම් පළ කිරීමට ලංකා බැංකුවේ කිරිබත්ගොඩ අධිශ්‍රේණි ශාඛාවේ ජ්‍යෙෂ්ඨ කළමනාකරුහට ද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අදිකාරි පත්තුවේ, වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වත්තල ප්‍රාදේශීය සභා සීමාවේ (වැලිසර උප කාර්යාලය) හීන්කෙන්ද, අංක 254 දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මහර හීන්කෙන්ද ග්‍රාමයේ පිහිටි කුරුකුලාව පල්ලිය පාර, වරිපනම් අංක 03 දරන "මීගහවත්ත කහටගහවත්ත සහ අඳඹතුදෙන

පිටමුල්ලේකුඹුරේ ඕවිට" නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ජී. එම්. කමල් පෙරේරා විසින් සාදන ලද 2019 මාර්තු 27 දිනැති අංක 906 දරන පිඹුරේ නිරූපනය කළ ලොට් 1 ලෙස ලකුණු කළ බෙදන ලද්දා වූ විස්තර කළ එකී ලොට් 1 හි මායිම් නම්, උතුරට : අංක 457/1987 දරන පිඹුරේ ලොට් A 2හි ඉතිරි කොටස ද, නැගෙනහිරට : එම ඉඩමේ ඉතිරි කොටස ද, දකුණට : පාර ද, බස්නාහිරට : යූ. ඩී. ප්‍රැන්සිස් ඇන්තෝනිගේ ඉඩම ද මායිම්ව එකී අංක 906 දරන පිඹුර අනුව පර්චස් විසිහතරක් (පර්. 24) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ L 500/39 හි ලියාපදිංචි කර ඇත.

එකී අංක 906 දරන පිඹුරේ ලොට් 1 පහත විස්තර කළ ඉඩමේ නැවත මනින ලද උප කොටසකි.

එකී මහර හීන්කෙන්ද ග්‍රාමයේ පිහිටි "මීගහවත්ත කහටගහවත්ත සහ අඳඹතුදෙන පිටමුල්ලේකුඹුරේ ඕවිට *හෙවත්* භාග කොටස" (මීගහවත්ත කහටගහවත්ත කැබැල්ල කොටසක් සහ අඳඹතුදෙන පිටමුල්ලේකුඹුර ඕවිට *හෙවත්* දූන් භාග කොටස යනුවෙන් ලියාපදිංචි කර ඇති) නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු කේ. ඒ. රූපසිංහ විසින් සාදන ලද 1987 සැප්තැම්බර් 02 දිනැති අංක 457/1987 දරන පිඹුරේ මායිම් නිරූපණය කළ ලොට් A 2 ලෙස ලකුණුකළ බෙදන ලද්දා වූ විස්තර කළ එකී ලොට් A 2 හි මායිම් නම්, උතුරට : කුරුකුලාව පාර සහ ලොට් A 1 ද, නැගෙනහිරට : ජයවර්ධනගේ ඉඩම සහ එම ඉඩමේ ඉතිරි කොටස ද, දකුණට : ඩී. ඩී. සී. පාර ද, බස්නාහිරට : යූ. ඩී. ප්‍රැන්සිස් අන්තෝනි සහ එස්. ජයසිංහගේ ඉඩම ද මායිම්ව එකී අංක 457/1987 දරන පිඹුර අනුව අක්කර එකයි පර්චස් හයයි දශම පහයි බිංදුවක් (අ.1, පර්. 6.50) බිම් ප්‍රමාණයකින් යුක්ත වේ. මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ L 114/07 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකු අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ජේ. ඩී. හෙට්ටිආරච්චි,
ජ්‍යෙෂ්ඨ කළමනාකාරිනි.

ලංකා බැංකුව,
අධිශ්‍රේණි ශාඛාව - කිරිබත්ගොඩ.

01-44

---

## ලංකා බැංකුව - දිවුලපිටිය ශාඛාව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන පනතින් හා 2000 අංක 54 දරන පනතින් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වන වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම

2023.12.04 දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන් ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් එම්. ඩී. අයි. කේ. කරුණාරත්න සහ ප්‍රසිද්ධ නොතාරිස් යූ. බී. ප්‍රේමතිලක යන නොතාරිස්වරුන් විසින් සහතික කරන ලද 2013.05.09 සහ 2013.05.10 දිනැති අංක 463/24072 දරන උකස් බැඳුම්කර, ප්‍රසිද්ධ නොතාරිස් එම්. ඩී. අයි. කේ. කරුණාරත්න විසින් සහතික කරන ලද 2015.07.03 දිනැති අංක 1227 දරන උකස් බැඳුම්කරය, ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. ඒ. එස්. අනුරාධා විසින් සහතික කරන ලද 2020.02.03 දිනැති අංක 933 දරන උකස් බැඳුම්කරය, ප්‍රසිද්ධ නොතාරිස් එම්. ඩබ්ලිව්. ඒ. එස්. පී. විජේවික්‍රම විසින් සහතික කරන ලද 2022.01.07 දිනැති අංක 2805 දරන උකස් බැඳුම්කරය අනුව 1 වන ණය මත 2023.10.10 දිනය තෙක් මුල් මුදල හා පොළිය වශයෙන් රු. 10,510,949.79ක (රුපියල් එක්කෝටි පන් ලක්ෂ දස දහස් නවසිය හතළිස් නවයයි ශත හැත්තෑ නවයක්) මුදලක් සමග රු. 6,490,000.00 ක (රුපියල් හැටහතර ලක්ෂ අනූදාහක්) මත වසරකට සියයට විසිපහයි දශම දෙකයි පහක් (25.25%) බැගින් 2023.10.11 දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් තවදුරටත් පොළිය ද, 2 වන ණය මත 2023.10.10 දිනය තෙක් මුල් මුදල හා පොළිය වශයෙන් රු. 10,192,783.52ක (රුපියල් එක් කෝටි එක් ලක්ෂ අනූදෙදහස් හත්සිය අසූතුනයි ශත පනස් දෙකක්) මුදලක් සමග රු. 6,293,332.00 (රුපියල් හැට දෙලක්ෂ අනූතුන් දහස් තුන්සිය තිස් දෙකක්) මත වසරකට සියයට විසිපහයි දශම දෙකයි පහක් (25.25%) බැගින් 2023.10.11 දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් තවදුරටත් පොළිය ද, 3 වන ණය මත 2023.10.10 දිනය තෙක් මුල් මුදල හා පොළිය වශයෙන් රු. 2,537,285.58ක (රුපියල් විසිපන් ලක්ෂ තිස්හත් දහස් දෙසිය අසූපහයි ශත පනස් අටක්) මුදලක් සමග රු. 1,573,332.00 (පහළොස් ලක්ෂ හැත්තෑ තුන් දහස් තුන්සිය තිස් දෙකක්) මත වසරකට සියයට විසිපහයි දශම දෙකයි පහක් (25.25%) බැගින් 2023.10.11 දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් තවදුරටත් පොළිය ද, 4 වන ණය මත 2023.10.10 දිනය තෙක් මුල් මුදල හා පොළිය වශයෙන් රු. 616,968.19ක (රුපියල් හය ලක්ෂ දහසය දහස් නවසිය හැටඅටයි ශත දහනවයක්) මුදලක් සමග රු. 502,743.92 (රුපියල් පන් ලක්ෂ දෙදහස් හත්සිය හතළිස් තුනයි ශත අනූදෙකක්) මත වසරකට සියයට දොළහක් (12%) බැගින් 2023.10.11 දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් තවදුරටත් පොළිය ද, මරදගමුල, රන්ජ්ලැන්ඩ් වත්ත, අංක 342/01 හි ඩිල්ෂාන් තිවංක ප්‍රේමරත්න මහතාගෙන් අය විය යුතු ව ඇත.

2. එකී 2013.05.09 සහ 2023.05.10 දිනැති අංක 463/24072 දරන උකස් බැඳුම්කරය, 2015.07.03 දිනැති අංක 1227 දරන උකස් බැඳුම්කරය, 2020.02.03 දිනැති අංක 933 දරන උකස්

බැඳුම්කරය සහ, 2022.01.07 දිනැති අංක 2805 දරන උකස් බැඳුම්කරය අනුව 1 වන ණය මත රු. 10,510,949.79ක (රුපියල් එක්කෝටි පන් ලක්ෂ දස දහස් නවසිය හතළිස් නවයයි ශත හැත්තෑ නවයක්) මුදලක් ද 2 වන ණය මත රු. 10,192,783.52ක (රුපියල් එක් කෝටි එක් ලක්ෂ අනූදෙදහස් අසූතුනයි ශත පනස් දෙකක්) මුදලක් ද, 3 වන ණය මත රු. 2,537,285.58ක (රුපියල් විසිපන් ලක්ෂ තිස්හත් දහස් දෙසිය අසූපහයි ශත පනස් අටක්) ද 4 වන ණය මත රු. 616,968.19ක (රුපියල් හයලක්ෂ දහසය දහස් නවසිය හැටඅටයි ශත දහනවයක්) මුදලක් ද, 2023.10.11 දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත සඳහන් පරිදි පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද, අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළොන්නාව, විහාර මාවත, අංක 50/3, M/S T&H ඔක්ෂන්ස් හි වෙන්දේසිකාර M. H. T. කරුණාරත්න හට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වන වගන්තිය යටතේ ද ලංකා බැංකු ආඥාපනතේ 21 වන වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුවේ දිවුලපිටිය ශාඛාවේ කළමනාකාර මහත්මිය හට ද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, උතුර දුනගහ පත්තුවේ, දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දිවුලපිටිය ප්‍රාදේශීය සභා සීමාවේ, උරපන බී අංක 86 දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ උරපන, කැලැපිටිමුල්ල සහ මාපලන්ගෙදර ග්‍රාමයන් හි පිහිටි "රන්ප්ලෑන්ඩ් එස්ටේට්" නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. විතාරණ විසින් සාදන ලද 1998 අගෝස්තු 05 දිනැති අංක 3248 දරන පිඹුරේ මායිම් නිරූපණය කර බෙදන ලද්දා වූ විස්තර කළ එකී ඉඩමේ මායිම් නම්, උතුරට : ඊබට් පොන්සේකා සහ ගුණතිලක පොන්සේකා හිමිකම් කියන ලොට් 137 ද, නැගෙනහිරට : ක්ලීටස් ෆොන්සේකා සහ ගුණතිලක ෆොන්සේකා හිමිකම් කියන ලොට් 109 ද, දකුණට : ප්‍රධාන පාර (ආර්. ඩී. ඒ.) ද, බස්නාහිරට : ප්‍රාදේශීය සභා පාර ද මායිම් ව එකී අංක 3248 දරන පිඹුර අනුව රූඩ් එකක් (රූ.1) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙම ඉඩම මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ J 25/62 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකු අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඩබ්ලිව්. ඒ. ජී. ඩී. වේරගොඩ,
කළමනාකාරිණි.

ලංකා බැංකුව,
දිවුලපිටිය ශාඛාව.

01-45

---

### ලංකා බැංකුව - මීරිගම අධිශ්‍රේණි ශාඛාව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන පනතින් සහ 2000 අංක 54 දරන පනතින් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වන වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම

2023.11.21 දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන් ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. ඒ. සචිනි අනුරාධා විසින් සහතික කරන ලද 2022.04.27 දිනැති අංක 1713 දරන උකස් බැඳුම්කරය අනුව ණය මත 2023.11.07 දිනය තෙක් මුල් මුදල හා පොළිය වශයෙන් රු. 21,691,060.11ක (රුපියල් දෙකෝටි දහසය ලක්ෂ අනූඑක් දහස් හැටයි ශත එකොළහක්) මුදලක් සමග රු. 17,333,328.00ක (රුපියල් එක් කෝටි හැත්තෑ තුන් ලක්ෂ තිස්තුන් දහස් තුන්සිය විසි අටක්) මත වසරකට සියයට විසිතුනයි දශම දෙකයි පහක් (23.25%) බැගින් 2023.11.08 දින සිට ගෙවීම නිම කරන දිනය තෙක්, තවදුරටත් පොළිය ද, ගෝනවිල, මාකඳුර, අංක 316, වලාන ගොඩගේ අනුර මහේන්ද්‍ර රණවීර මහතාගෙන් අය විය යුතුව ඇත.

2. ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. ඒ. සචිනි අනුරාධා විසින් සහතික කරන ලද 2022.04.27 දිනැති අංක 1713 දරන උකස් බැඳුම්කරය අනුව ණය මත රු. 21,691,060.11ක (රුපියල් දෙකෝටි දහසය ලක්ෂ අනූඑක් දහස් හැටයි ශත එකොළහක්) මුදලක් ද 2023.11.08 දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත සඳහන් පරිදි තවදුරටත් පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද, අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළොන්නාව, විහාර මාවත, අංක 50/3, ටී ඇන්ඩ් එච් ඔක්ෂන් හි වෙන්දේසිකාර එම්. එච්.ටී. කරුණාරත්න හට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වන වගන්තිය යටතේ ද ලංකා බැංකු ආඥාපනතේ 21 වන වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම් පළ කිරීමට ලංකා බැංකුවේ මීරිගම අධිශ්‍රේණි ශාඛාවේ ජ්‍යෙෂ්ඨ කළමනාකාර මහත්මිය හට ද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කටුගම්පොල හත්පත්තුවේ, පිටිගල් කෝරළයේ, පන්නල ප්‍රාදේශීය සභා සීමාවේ (මාකඳුර උප කාර්යාලය), පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පහල මාකඳුර, අංක 1589 දරන ග්‍රාමසේවා නිලධාරි කොට්ඨාසයේ, ඉහළ මාකඳුර හි පිහිටි "පොල්කන්දවල කුඹුර (වර්තමානයේ ගොඩ බිම)" නමැති ඉඩමේ බලයලත්

මිනින්දෝරු යූ. එස්. කේ. එදිරිසිංහ විසින් සාදන ලද 2021 අගෝස්තු 17 දිනැති අංක 7929 දරන පිඹුරේ මායිම් නිරූපණය කර ලොට් 1 ලෙස ලකුණු කළ බෙදන ලද්දා වූ විස්තර කළ ඉඩම් කැබැල්ල, එනම් එකී ලොට් 1 උතුරට : රුවනි විජේසිංහ හිමිකම් කියන කුඹුර ද, නැගෙනහිරට : අංක 5668 දරන පිඹුරේ මායිම් නිරූපණය කළ ලොට් 2 ද, දකුණට : ලොට් 3 (අඩි 15 ක් පළල ප්‍රවේශ මාර්ගය) සහ එකී පිඹුරේ ලොට් 2 ද, බස්නාහිරට : කේ. ඒ. කෝකිල අනුෂාන් සිරිවර්ධන හිමිකම් කියන ඉඩම සහ අංක 3659 දරන පිඹුරේ ලොට් 1 ද, මායිම්ව එකී අංක 7929 දරන පිඹුර අනුව රූඩ් තුනයි පර්චස් තිහක් (රූ.03, පර්. 30) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙම ඉඩම කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ E330/135 හි ලියාපදිංචි කර ඇත.

තව ද, එකී අංක 7929 දරන පිඹුරේ මායිම් නිරූපණය කළ ලොට් 3 (අඩි 15ක් පළල ප්‍රවේශ මාර්ගය) මත හා එය දිගේ මාර්ග අයිතිය ද වේ.

එකී ලොට් 1 සහ ලොට් 3 (ප්‍රවේශ මාර්ගයන්) පහත විස්තර කළ ඉඩමේ උප බෙදුම්වේ.

එකී පරිදි ඉහළ මාකඳුර හි පිහිටි "පොල්කන්දවල කුඹුර" නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු යූ. එස්. කේ. එදිරිසිංහ විසින් සාදන ලද 2017 ඔක්තෝබර් 01 දිනැති අංක 5668 දරන පිඹුරේ මායිම් නිරූපණය කර ලොට් 1 ලෙස ලකුණු කළ බෙදන ලද්දා වූ විස්තර කළ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 1, උතුරට : බලයලත් මිනින්දෝරු යූ. එස්. කේ. එදිරිසිංහ විසින් සාදන ලද අංක 3659 දරන පිඹුරේ මායිම් නිරූපණය කළ ලොට් 1 සහ රුවනි විජේසිංහ හිමිකම් කියන කුඹුර ද, නැගෙනහිරට : අංක 5668 දරන පිඹුරේ මායිම් නිරූපණය කළ ලොට් 2 ද, දකුණට: දංකොටුව සිට ගිරිඋල්ල දක්වා ප්‍රධාන පාර සහ ඩබ්ලිව්. ලක්මාල් ප්‍රියශාන්ත හිමිකම් කියන ඉඩම ද, බස්නාහිරට: ඩබ්ලිව්. ලක්මාල් ප්‍රියශාන්ත හිමිකම් කියන ඉඩම, කේ. එකෝකිල අනුෂාන් සිරිවර්ධන හිමිකම් කියන ඉඩම සහ අංක 3659 දරන පිඹුරේ මායිම් නිරූපණය කළ ලොට් 1 ද, මායිම්ව එකී අංක 5668 දරන පිඹුර අනුව අක්කර එකයි රූඩ් තුනයි පර්චස් දහ නවයයි දශම පහයි බිංදුවක් (අ.01, රූ.03, පර්. 19.50) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙම ඉඩම කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ E 330/102 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකු අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. පී. කේ. ටී. එන්. අමරසේන,
ජ්‍යෝෂ්ඨ කළමනාකාරිණි.

ලංකා බැංකුව,
අධිශ්‍රේණි ශාඛාව, මීරිගම.

01-42

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥා පනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන වෙන්දේසියේ විකිණීමේ දැන්වීම

2023.12.06 වැනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. බදුල්ල ප්‍රසිද්ධ නොතාරිස් ඩී. එම්. එන්. එස්. දිසානායක විසින් සහතික කරන ලද 2019.02.07 දිනැති අංක 1002 දරන උකස් බැඳුම්කරය සහ බදුල්ල ප්‍රසිද්ධ නොතාරිස් පී. ඒ. උදයාංගනී විසින් සහතික කරන ලද 2019.11.19 දිනැති අංක 833 දරන උකස් බැඳුම්කරය අනුව 1 වන ණය මත 2023.10.25 දිනය තෙක් මුල් මුදල සහ පොළිය වශයෙන් රු. 29,074,420.94 ක (රුපියල් දෙකෝටි අනූ ලක්ෂ හැත්තෑහතර දහස් හාරසිය විස්සයි ශත අනූහතරක්) මුදලක් සමග රු. 17,666,662.00 (රුපියල් එක් කෝටි හැත්තෑහය ලක්ෂ හැටහය දහස් හයසිය හැට දෙකක්) මත වසරකට සියයට විසිතුනයි දශම පහයි බිංදුවක් (23.50%) බැගින් 2023.10.26 දින සිට ගෙවීමේ දිනය තෙක් තවදුරටත් පොළිය ද, 2 වන ණය මත 2023.10.25 දිනය තෙක් මුල් මුදල සහ පොළිය වශයෙන් රු. 12,005,584.14 ක (රුපියල් එක්කෝටි විසි ලක්ෂ පන් දහස් පන්සිය අසූහතරයි ශත දාහතරක්) මුදලක් සමග රු. 9,489,746.56 (රුපියල් අනූහතර ලක්ෂ අසූනව දහස් හත්සිය හතලිස් හයයි ශත පනස් හයක්) මත වසරකට සියයට දහතුනයි දශම අටයි හයක් (13.86%) බැගින් 2023.10.26 දින සිට ගෙවීමේ දිනය තෙක් තවදුරටත් පොළිය ද, 3 වන ණය මත 2023.10.25 දිනය තෙක් මුල් මුදල සහ පොළිය වශයෙන් රු. 6,186,072.23 ක (රුපියල් හැටඑක් ලක්ෂ අසූහය දහස් හැත්තෑ දෙකයි ශත විසිතුනක්) මුදලක් සමග රු. 4,718,974.70 (රුපියල් හතලිස් හත් ලක්ෂ දහඅට දහස් නවසිය හැත්තෑ හතරයි ශත හැත්තෑවක්) මත වසරකට සියයට දහතුනයි දශම අටයි හයක් (13.86%) බැගින් 2023.10.26 දින සිට ගෙවීමේ දිනය තෙක් තවදුරටත් පොළිය ද ඇල්ල, පස්සර පාර, අඹගොල්ලපතන හි වීරවර්ණ නිලවීර රම්පටබැඳිගේ දයාරත්න මහතා සහ වීරවර්ණ නිලවීර රම්පටබැඳිගේ ශානිකා ඉෂානි මහත්මිය යන අය වෙතින් අය විය යුතුව ඇත.

2. බදුල්ල ප්‍රසිද්ධ නොතාරිස් ඩී. එම්. එන්. එස්. දිසානායක විසින් සහතික කරන ලද 2019.02.07 දිනැති අංක 1002 දරන උකස් බැඳුම්කරය සහ බදුල්ල ප්‍රසිද්ධ නොතාරිස් පී. ඒ. උදයාංගනී විසින් සහතික කරන ලද 2019.11.19 දිනැති අංක 833 දරන උකස් බැඳුම්කරය මත රු. 29,074,420.94 ක

(රුපියල් දෙකෝටි අනූ ලක්ෂ හැත්තෑහතර දහස් හාරසිය විස්සයි ශත අනූහතරක්) මුදලක් ද, රු. 12,005,584.14 ක (රුපියල් එක්කෝටි විසි ලක්ෂ පන් දහස් පන්සිය අසූ හතරයි ශත දාහතරක්) මුදලක් ද, රු. 6,186,072.23 ක (රුපියල් හැටඑක් ලක්ෂ අසූ හය දහස් හැත්තෑ දෙකයි ශත විසිතුනක්) මුදලක් ද 2023.10.26 දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී පරිදි පොළිය ද ලංකා බැංකු ආඥා පනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොලොන්නාව, විහාර මාවත, අංක 50/3, T & H ඔක්ෂන් හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා හට එකී ලංකා බැංකු ආඥා පනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වන වගන්තිය යටතේ ද ලංකා බැංකු ආඥාපනතේ 21 වන වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළකිරීමට ලංකා බැංකුව ඇල්ල ශාඛාවේ කළමනාකරු හට ද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### උකස් බැඳුම්කරයේ සඳහන් උපලේඛනය

1. ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුඹල්වෙල කෝරලයේ, ඇල්ල නගර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ඇල්ල නගරයේ පිහිටි, "දඹගොල්ල පතන" නමැති ඉඩම බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ඒ. එම්. කේ. කරුණාරත්න විසින් සාදන ලද 2018.10.29 දිනැති අංක 5365 දරන පිඹුරේ ලොට් 1 ලෙස මායිම් නිරූපණය කර බෙදන ලද්දා වූ එකී ලොට් 1, උතුරට : ටී. එස්. පී. පී. 11 හි ලොට් 144 සහ 161 ද, නැගෙනහිරට ටී. එස්. පී. පී. 11 හි ලොට් 161, 258, 260, 243, 239, සහ 234 ද, දකුණට : ටී. එස්. පී. පී. 11 හි ලොට් 258, 260, 243, 239, 234, 137 සහ 261 ද බස්නාහිරට : ටී. එස්. පී. පී. 11 හි ලොට් 261 සහ 144 ද මායිම්ව රූඩ් දෙකයි පර්චස් බිංදුවයි දශම තුනයි අටක් (අ.0, රූ.2, පර්.0.38) බිම් ප්‍රමාණයක් සමග එහි පිහිටි සියලු දේ සමග වේ.

එකී ලොට් 1 ඉඩමේ නැවත මිනුමකි.

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුඹල්වෙල කෝරලයේ, ඇල්ල නගර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, අඹගොල්ල ග්‍රාමයේ පිහිටි, "දඹගොල්ල පතන" නමැති ඉඩම බලයලත් මිනින්දෝරු ඒ. එන්. කිනිගම විසින් සාදන ලද 2018.06.22 දිනැති අංක 2662 දරන පිඹුරේ ලොට් A ලෙස මායිම් නිරූපණය කර බෙදන ලද්දා වූ එකී ලොට් A, උතුරට : ටී. එස්. පී. පී. 11 හි ලොට් 144 සහ 161 ද, නැගෙනහිරට : ටී. එස්. පී. පී. 11 හි ලොට් 161, 258, 260, 243, 239 සහ 234 ද, දකුණට : ටී. එස්. පී. පී. 11 හි ලොට් 258, 260, 243, 239, 234, 137 සහ 261 ද, බස්නාහිරට : ටී. එස්. පී. පී. 11 හි ලොට් 261 සහ 144 ද මායිම්ව රූඩ් දෙකයි පර්චස් බිංදුවයි දශම තුනයි අටක් (අ.0, රූ.02, පර්.0.38) බිම් ප්‍රමාණයක් සමග එහි පිහිටි සියලු දේ සමග වේ.

එකී ලොට් A පහත සඳහන් ඉඩම හා සමාන වේ.

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුඹල්වෙල කෝරලයේ, ඇල්ල නගර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, අඹගොල්ල ග්‍රාමයේ පිහිටි, "දඹගොල්ල පතන" නමැති ඉඩම මිනින්දෝරු ජනරාල් විසින් සාදන ලද අංක ටී. එස්. පී. පී. 11 දරන පිඹුරේ ලොට් 257 ලෙස මායිම් නිරූපනය කර බෙදන ලද්දා වූ එකී ලොට් 257, උතුරට : ලොට් 144 සහ 161 ද, නැගෙනහිරට : ලොට් 161, 258, 260, 243, 239 සහ 234 ද, දකුණට : ලොට් 258, 260, 243, 239, 234, 137 සහ 261 ද බස්නාහිරට : ලොට් 261 සහ 144 ද මායිම්ව හෙක්ටෙයාර බිංදුවයි දශම දෙකයි බිංදුවයි තුනයි තුනක් (හෙක්. 0.2033) බිම් ප්‍රමාණයක් සමග එහි පිහිටි සියලු දේ සමග වේ. මෙම ඉඩම බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ LDO/U 06/154 හි ලියාපදිංචි කර ඇත.

### වෙන්කිරීම්

1. සියලු ඛනිජ (ඔප්පුවේ මෙම යෙදුමට වටිනා ගල් ද ඇතුළත් වේ.) පිළිබඳ හිමිකම සහ ඒවා හෑරීම සෙවීම ඒ සම්බන්ධව වැඩ කිරීම සහ එවැනි ඛනිජ බැහැරකිරීම යනාදි අයිතීන් රජය සතුය.

2. මෙම ඉඩමට අයිතිකරුවන් සතු හිමිකම වන්නේ මෙම ප්‍රදානයේ දිනයේ සිට පාරේ අයිතිය හා පවත්නා වෙනත් පරවශ්‍යතාවන්ට යටතේ වේ.

### කොන්දේසි

1. අයිතිකරු විසින් ගොඩ ඉඩමෙන් මෙහි නිශ්චිතව දක්වා ඇති හෙක්ටෙයාර 0.025 කට වඩා අඩු උප බෙදුම් ඒකකයක් බැහැර නොකළ යුතුය.

2. අයිතිකරු විසින් මෙහි 1/8 ලෙස නම් කොට නිශ්චිතව දක්වා ඇති ඉඩම් කොටසකට වඩා අඩු නොබෙදූ කොටසක් බැහැර නොකළ යුතුය.

3. කිසිවකුට ඉහත කොන්දේසි 1 හි නිශ්චිතව දක්වා ඇති උප බෙදීම් ඒකකයකට වඩා ප්‍රමාණයෙන් අඩු බෙදන ලද කොටසකට අයිතිකරුවකු විය නොහැක.

4. කිසිවකුට ඉහත කොන්දේසි 2 හි නිශ්චිතව දක්වා ඇති උප බෙදීම් ඒකකයකට වඩා ප්‍රමාණයෙන් අඩු අවම නොබෙදූ කොටසක අයිතිකරුවකු විය නොහැක.

5. ඉඩමට හෝ එහි කිසියම් කොටසකට ජලය සැපයිය හැකි නම් හෝ දැනටමත් ඉදිකර ඇති යම් වාරි මාර්ග කාර්යයක් ඉදිකිරීමක් හෝ ඉදිකිරීමට ඇති යමක් හේතුවෙන් ජලය සැපයිය හැකි බවට පත්වන්නේ නම් හෝ එම ජලය සැපයිය හැකි ප්‍රදේශය සම්බන්ධයෙන් අයිතිකරු වාරිමාර්ග ආඥාපනතේ (453 වගන්තිය) ඇති ප්‍රතිපාදන වලට අනුකූලව කටයුතු කළ යුතුය.

6. දිසාපතිගෙන් ලිඛිත අවසරයක් සහ අදාළ අධිකාරිගෙන් බලපත්‍රයක් ලබා නොගෙන එම ඉඩම් මත හෝ ඒ තුළ ඇති කිසිදු ඛනිජ ද්‍රව්‍යයක් හෑරීම සෙවීම භාවිතයට ගැනීම විකිණීම හෝ අන් ආකාරයකින් බැහැර කිරීම අයිතිකරු විසින් නොකළ යුතුය.

7. ප්‍රාදේශීය ලේකම්ගේ පූර්ව අනුමැතිය ලිඛිතව ලබා නොගෙන මෙම ඉඩම හෝ එහි ඕනෑම කොටසක් බැහැර නොකළ යුතුය.

ලංකා බැංකු අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ටී. එම්. එල්. එස්. තෙන්නකෝන්,
කළමනාකරු,

ලංකා බැංකුව,
ඇල්ල ශාඛාව.

01-43

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවත් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

### 2024 වර්ෂය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| **ජනවාරි** | 2024.01.05 | සිකුරාදා | 2023.12.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.01.12 | සිකුරාදා | 2023.12.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.01.19 | සිකුරාදා | 2024.01.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.01.26 | සිකුරාදා | 2024.01.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| **පෙබරවාරි** | 2024.02.02 | සිකුරාදා | 2024.01.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.02.09 | සිකුරාදා | 2024.01.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.02.16 | සිකුරාදා | 2024.02.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.02.22 | බ්‍රහස්පතින්දා | 2024.02.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| **මාර්තු** | 2024.03.01 | සිකුරාදා | 2024.02.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.03.07 | බ්‍රහස්පතින්දා | 2024.02.22 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2024.03.15 | සිකුරාදා | 2024.03.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.03.22 | සිකුරාදා | 2024.03.07 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2024.03.28 | බ්‍රහස්පතින්දා | 2024.03.15 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.